

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

Since 1872

# 2013

## සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
## வ/ப கொழும்பு கொமர்ஷல் உரக் கம்பனி
## COLOMBO COMMERCIAL FERTILIZERS LTD

# වාර්ෂික වාර්තාව

# 2013


**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

**දළුපිටිය පාර, හුණුපිටිය, වත්තල**

*දුරකථන: 011-2948102/03, 011-2941859*

*ෆැක්ස්: 011-2930252, 011-2949126*

*ඊමේල්: ccffinance@yahoo.com*

## දැක්ම

“කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා
නොපමාව නිෂ්පාදනය කොට බෙදා හැරීම තුළින්
ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ධනාත්මකව දායකත්වය සැපයීම තුළින්
රාජ්‍ය අංශය සතු ආදර්ශමත් ආයතනයක් වශයෙන් ක්‍රියා කිරීම”.

## මෙහෙවර

“ශ්‍රී ලාංකාවේ ප්‍රමුඛතම පොහොර නිෂ්පාදකයා හා බෙදා හරින්නා බවට පත්වෙමින්
රජයේ කෘෂිකර්මාන්තය සඳහා වූ දැක්මේ සාඩම්බර හිමිකරුවකු වෙමින්
නිෂ්පාදන විවිධාංගීකරණය, උසස් තත්වයේ නිෂ්පාදන එළිදැක්වීම
සහ
ආයතනයේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අනුව කටයුතු කරමින්
ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා
අවස්ථාව උදාකරගැනීම”.

වටිනාකම

- වගවීම
- අධීක්ෂණය
- විනිවිදභාවය
- පරිසරය සුරැකීම
- ගුණාත්මකභාවය
- තිරසාරභාවය
- දිරිගැන්වීම

| | පටුන | පිටු අංකය |
|---|---|---|
| **1** | වගකීම | |
| 1.1 | සභාපතිතුමාගේ සමාලෝචනය | 01 |
| 1.2 | අධ්‍යක්ෂ මණ්ඩලය | 03 |
| 1.3 | විගණන හා කළමණාකරණ කමිටුව | 03 |
| 1.4 | ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව | 03 |
| 1.5 | ආයතනික යහපාලනය | 04 |
| **2.** | කාර්යසාධන දර්ශන | |
| 2.1 | වෙළඳපොළ තත්වය | 06 |
| 2.2 | ආයතනයේ කාර්යසාධනය | 06 |
| 2.3 | මූල්‍ය ප්‍රගතිය | 07 |
| 2.4 | සමාගමේ පසුගියාව | 08 |
| 2.5 | **2013** මාර්තු **31** දිනෙන් අවසන් වර්ෂය තුල සිදුවීම් | 08 |
| **3.** | කළමණාකරණ විශ්ලේෂණ | 09 |
| 3.1 | ව්‍යාපාරික සමාලෝචනය | 10 |
| 3.2 | ආයතනික ව්‍යුහය හා බෙදාහැරීමේ ජාලය | 12 |
| 3.3 | සැපයුම් දාම කළමණාකරණය | 13 |
| 3.4 | මිනිස් ශ්‍රම ප්‍රාග්ධන දර්ශකය | 15 |
| 3.5 | මිනිස් ශ්‍රම ප්‍රාග්ධන මූල්‍ය සමාලෝචනය | 15 |
| 3.6 | මානව සම්පත්හි දැනුම වර්ධනය සඳහා යොදාගත් වැඩසටහන් | 15 |
| **4.** | මූල්‍ය වාර්තාකරණය | |
| • | අධ්‍යක්ෂක මණ්ඩල සමාලෝචනය | 16 |
| • | අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 18 |
| • | සභාපතිවරයාගේ හා මූල්‍ය කළමණාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 19 |
| • | විගණකාධිපතිතුමාගේ වාර්තාව | 20 |
| • | විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 25 |
| • | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 26 |
| • | ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 27 |
| • | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 28 |
| • | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 29 |
| • | මූල්‍ය වාර්තාවලට අදාල සටහන් | 40 |
| **5.** | සංස්ථා තොරතුරු | 60 |

# 1 වගකීම

## 1.1 . සභාපතිතුමාගේ සමාලෝචනය

<u>කාර්යසාධනය</u>

මහින්ද චින්තන සහනාධාර පොහොර වැඩසටහන යටතේ දිවයිනේ වී වගාව සඳහා අවශ්‍ය කරන පොහොර ප්‍රමාණයෙන් 35% ප්‍රමාණයක් බෙදාහැරීමේ කාර්යයේ අප සමාගම නියලී සිටී. මෙයට අමතරව ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් අප සමාගම වෙත වෙන්කොට දී ඇති අනෙකුත් භෝග සඳහා වන පොහොර ප්‍රමාණයන්ද අපගේ මධ්‍යම ගබඩාව සහ දිවයින පුරා පිහිටි අනෙකුත් ප්‍රාදේශීය ගබඩාවන් 17 හරහා බෙදාහරිනු ලබයි.

2012/13 ගිණුම් කාලපරිච්ඡේදය තුල සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ් සහ ට්‍රිපල් සුපර් පොස්ෆේට් යන පොහොර වර්ගයන් තුනෙන් සමන්විත පොහොර මෙ.ටොන් 124,800 ආනයනය කොට ඇති අතර එම කාලපරිච්ඡේදය තුල පොහොර මෙ.ටොන් 129,000 බෙදාහැරීම් කොට තිබේ. මෙම කාලපරිච්ඡේදය තුල පිරිවැටුම රු. මිලියන 867 වූ අතර බදුවලට පසු ශුද්ධ ලාභය රු. මිලියන 123 උපයා ගන්නා ලදී.

<u>ඒකාබද්ධ අරමුදලට දායකත්වය</u>

අදාල කාලපරිච්ඡේදයට අදාළව ආදායම් බදු වශයෙන් රු.මිලියන 58 දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට ඇස්තමේන්තු කොට තිබේ.

<u>ලාභාංශ</u>

රජයේ ඒකාබද්ධ අරමුදලට රුපියල් මිලියන 10 මුදලක් ලාභාංශ වශයෙන් ගෙවීමට තීරණය කිරීම ගැන සඳහන් කිරීමට ලැබීමද මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

<u>විගණන වාර්තාව</u>

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ වාර්තාව පිටු අංක 20 සිට 24 දැක්වේ.

<u>මූල්‍ය ප්‍රකාශණය</u>

සමාගමේ මූල්‍ය ප්‍රකාශණ පිටු අංක 25 සිට 28 හි දැක්වේ.

<u>ගිණුම් ප්‍රතිපත්ති</u>

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම් ප්‍රතිපත්ති පිටු අංක 29 සිට 40 හි දැක්වේ.

<u>අනාගත දැක්ම</u>

නවීන උපාංගයන්ගෙන් යුත් වර්ග අඩි 10,000 කින් සමන්විත නව පරිපාලන ගොඩනැගිල්ලක් සහ වර්ග අඩි 25,000 සමන්විත හුණුපිටිය භූමි භාගයේ ඉදිකරමින් පවතින නව ගබඩාව ඉදිරි වර්ෂය තුල නිමකිරීමට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම බලාපොරොත්තු වන අතර මේ සඳහා වැය වන සම්පූර්ණ මුදලම ආයතනය විසින් දරනු ලැබේ. මෙමගින් අපගේ සේවක සේවිකාවන්ට මෙන්ම ගණුදෙණුකරුවන්ටද දැනට පොහොර ගබඩාවක් කාර්යාලයක් බවට

පරිවර්තනය කොට පවත්වාගෙන යනවාට වඩා වැඩි පහසුකම් සහිත වටපිටාවක් තුල කටයුතු කිරීමට හැකිවනු ඇත.

තවද මාගන්තොට මහින්ද රාජපක්ෂ වරායට ආසන්නයේ නව ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට සමාගම විසින් සැලසුම් කොට තිබෙන අතර මෙමගින් දකුණේ ගොවිජනතාවට කඩිනමින් පොහොර ලබාගැනීමට හැකිවීම සහ නව වරාය භාවිතා කිරීමෙන් කොළඹ වරායේ ඇති වන තදබදය අඩුකිරීමටද හැකි වනු ඇත.

<u>ස්තූතිය</u>

ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කල අප සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් ඇතුළු අනෙකුත් කළමණාකරුවන් සහ ලිපිකාර හා සමාන්තර සේවා වල කාර්ය මණ්ඩලය ඇතුළු ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මාගේ ස්තූතිය පල කරමි. අප ආයතනයේ ඉලක්ක සපුරාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දෙන ලද සහයෝගය හා දක්වන ලද දායකත්වය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පලකරනු ලබන අතර අදාල වර්ෂය තුල කිසිදු භිහයකින් තොරව පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා ආනයන කටයුතු සැලසුම් කිරීම ඇතුළු අනෙකුත් කාර්යයන් සඳහා මගපෙන්වීම සහ දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූතිය පල කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලය විසින් ආනයන බිල්පත් නියමිත දිනට පියවීම සඳහා දක්වන ලද සහයෝගය හා උපකාර සම්බන්ධයෙන්ද මහජන බැංකුවේ සභාපති තුමා ඇතුළු එහි ආයතනික ශාඛාවේ සහ වත්තල ශාඛාවේ නිලධාරී මහත්ම මහත්මීන්ට පොහොර ආනයනය සඳහා නියමිත දිනට ණයවර ලිපි විවෘත කිරීම සඳහා දැක්වූ සහයෝගය සම්බන්ධයෙන්ද ස්තූතිය පල කරමි.

අදාල වර්ෂයේ ආයතනයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය ලගාකර ගැනීමට සියලුම ගණුදෙණුකරුවන් දැක්වූ සහයෝගය සම්බන්ධයෙන්ද මාගේ ස්තූතිය පලකරමි. දේශීය ගොවිජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීම අරමුණුකොටගෙන අපගේ කාර්ය භාරය මැනවින් ඉටුකිරීම සඳහා අගනා සහයක් ලබාදෙන ලද ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, ගොවිජන සේවා කොමසාරිස්තුමාද ඇතුළු දිවයින පුරා පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථානවල කාර්යමණ්ඩලය විසින් ලබාදෙන ලද සහාය සම්බන්ධයෙන්ද මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

නීතිඥ එන්. එස්. එම්. සම්සුදීන්
සභාපති
සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

## 1.2 අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | එන්. එස්. එම්. සම්සුදීන් මයා (නීතිඥ) |
| විධායක අධ්‍යක්ෂ | ඩී. විජේරත්න මයා |
| අධ්‍යක්ෂ | රෝහණ අල්විස් මයා |
| අධ්‍යක්ෂ | එන්. පී. අමරතුංග මයා |
| අධ්‍යක්ෂ | ප්‍රියංගනී ලියනගේ මිය |
| අධ්‍යක්ෂ | එස්. එම්. ඩබ්. කොරසගල්ල මයා (නීතිඥ) |
| අධ්‍යක්ෂ | ටී. එම්. කේ. තෙන්නකෝන් මයා (නීතිඥ) |
| සමාගම් ලේකම් | එස්. පී. මොරවක මයා (නීතිඥ) |

## 1.3 විගණන හා කළමණාකරණ කමිටුව

| | | |
|---|---|---|
| 1. | ප්‍රියංගනී ලියනගේ මිය | සභාපති |
| 2. | රෝහණ අල්විස් මයා | සාමාජික |
| 3. | එච්. ඒ. වි. පී. හපන්ගම මයා | සාමාජික |
| 4. | කේ. බී. විමලසිරි මයා | සාමාජික |
| 5. | ඒ. පී. ජී. අතුකෝරාල මිය | නිරීක්ෂක |

## 1.4 ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

| | | |
|---|---|---|
| 1. | එච්. එන්. ආරියදාස මයා | මුදල් කළමණාකරු |
| 2. | කේ. කේ. සෝමසුන්දරම් මයා | නාවික හා සැපයුම් කළමණාකරු |
| 3. | ජේ. සී. වික්‍රමසිංහ මයා | වැඩ කළමණාකරු |
| 4. | වයි. ඒ. ඩී. පර්සි විජේරත්න මයා | බෙදාහැරීමේ කළමණාකරු |
| 5. | එච්. වි. ඒ. ජේ. විජේසිරි මයා | අභ්‍යන්තර විගණක |

## 1.5 ආයතනික යහපාලනය

පෞද්ගලික අංශයේ ආයතන මෙන්ම එහි කොටස් කරුවන්ටද එම ආයතන මෙහෙයවනු ලබන්නේ හුදෙක් ලාභය පදනම් කොට ගෙන මුත් සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි ක්‍රියාකාරිත්වය ඊට වඩා සංකීර්ණ වටපිටාවක් තුල පවත්වාගෙන යනු ලබයි.

විශේෂයෙන් මෙම සමාගමෙහි ලාභ ලැබීමේ අපේක්ෂාව ජාතික වැදගත් කමකින් යුතු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා බැදී පවතී.

තවද මෙම සමාගම එය පවත්වාගෙන යනු ලබන ප්‍රතිපත්ති, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය වැඩසටහන් උසස් ගණකාධිකරණ සහ විගණන ප්‍රමිතින් නිසි කාලවකවානු තුල ගොවි ජනතාව වෙත පොහොර ලබාදීම යන කරුණු මූලික කාර්යන්භිලා සලකා පවත්වාගෙන යනු ලබන අතර ගොවිජනතාවගේ කුඹුරු පොහොර අවශ්‍යතාවය සැපයීමේ වගකීම දරණ බැවින් මෙම ආයතනය ජාතික ආර්ථිකය හා දැඩි ලෙස බැදි පවත්වාගෙන යනු ලබන ආයතනයකි.

<u>සමාගමේ ආයතනික යහපාලන ආකෘතිය</u>



ඉහතින් දැක්වූ පාලන රටාව තුලින් ආයතනයට පහත සඳහන් කරුණු සාක්ෂාත් කරගැනීමට හැකිවිය.

<u>වගකීම</u>

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ වත්කම් හා සහ වටිනාකම් ආරක්ෂා කරන අතරම රජයේ අභිලාෂයන් සහ අනෙකුත් පාර්ශවයන්ගේ අවශ්‍යතාවයන් ලගාකරදීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාකාරකම්වල යෙදී සිටී.

<u>අධීක්ෂණය</u>

මහා භාණ්ඩාගාරය හා ආයතනය කෙරෙහි ඇල්මක් දක්වන්නාවූ පාර්ශවයන් ආරක්ෂා කරමින් ක්‍රියාකාරීව හා සක්‍රීය ලෙස ආයතනයේ පාලන කටයුතු හා ක්‍රියාකාරකම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගි වේ.

<u>විනිවිදභාවය</u>

නිවැරදි තොරතුරු නියමිත වෙලාවට රාජ්‍ය ආයතනවලට හා ආයතනය කෙරෙහි ඇල්මක් දක්වන්නාවූ පාර්ශවයන්ට සහ වෙළඳ පලට හෙලිකිරීමට අවශ්‍ය සෑම ප්‍රයත්නයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබේ.

<u>දිරිගැන්වීම</u>

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ සාමාජිකයින් වශයෙන් වඩාත්ම සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීමටත් ඔවුන් අභිප්‍රේරණය කිරීමටත් ආයතනය තුල රඳවාගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්තිමය වශයෙන් කටයුතු කරනු ලබයි.

## 2. කාර්යසාධන දර්ශන

### 2.1 වෙළඳපොළ තත්වය

**2005** වර්ෂයේ මහින්ද චින්තන වී පොහොර සහනාධාර වැඩසටහන යටතේ වී වගාව සඳහා යොදන යූරියා, ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් යන පොහොර මෙ.ටොන් **01** ක් රු. **7,000/-** බැගින් ලබාදීම ආරම්භවීමත් සමග තරගකාරි ලෙස පොහොර අලෙවියේ යෙදී සිටි පෞද්ගලික පොහොර සමාගම් වලට අනෙකුත් භෝග සඳහා පොහොර ආනයනය කොට බෙදාහැරීමට ඉඩ සලසා වී වගාව සඳහා පොහොර සැපයීමේ කාර්යය සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමට සහ සීමාසහිත ලංකා පොහොර සමාගමට පමණක් පැවරුණි.

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වී වගාව සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණයෙන් **35%** ප්‍රමාණයක් සහ සීමාසහිත ලංකා පොහොර සමාගම **65%** පොහොර ප්‍රමාණයක් ආනයනය කොට බෙදා හැරීමේ කාර්යයේ නියලෙන ලදි.

**2011** වර්ෂයේ සිට මහින්ද චින්තන පොහොර සහනාධාර වැඩ සටහන අනෙකුත් භෝග සඳහාද ව්‍යාප්ත කරන ලද අතර අනෙකුත් භෝග සඳහා පොහොර මෙ.ටොන් **01** ක් රු. **24,000/-** සහනාධාර මිල යටතේ පෞද්ගලික අංශය ඇතුළු සියළුම පොහොර වෙළඳාමේ යෙදී සිටින ආයතන විසින් බෙදාහැරිය යුතු බවට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලදි.

මේ අනුව එතෙක් පැවති මිල මත අලෙවි ප්‍රවර්ධන උපක්‍රමය නව කාර්යක්ෂම හා ක්‍රියාකාරි අලෙවි උපක්‍රම රටාවට මාරු වූ අතර ඒ අනුව සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමද අදාල වෙළඳපොළ වෙනස්වීම් වලට මුහුණ දෙන ලදි.

### 2.2 ආයතනයේ කාර්යසාධනය

**2012/13** වර්ෂයේ මෙම සමාගමට පොහොර බෙදාහැරීමේ හා පිරිවැටුමේ ඉලක්ක කරා ලගාවීමට හැකි විය. දේශගුණික තත්වය සෑම විටම වගාකරනු ලබන භූමි ප්‍රමාණය හා පොහොර සඳහා ඉල්ලුම තීරණය කරනු ලබයි.

## 2.3 මූල්‍ය ප්‍රගතිය

| | 2012/13 | 2011/12 | 2010/11 | 2009/10 |
|---|---|---|---|---|
| **මූල්‍ය කාර්යසාධනය (රු. 000)** | | | | |
| ආදායම | 866,809 | 982,118 | 1.070,228 | 916.759 |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (1,758) | 20,063 | | (223,044) |
| දළ ලාභය | 208,325 | 407,265 | 309.297 | 589,420 |
| බදු පෙර ලාභය / අලාභය | 181,929 | 314,143 | 326,514 | 106,598 |
| වසරේ ශුද්ධ ලාභය / අලාභය | 123,183 | 216,412 | 210,630 | 106,598 |
| **මූල්‍ය තත්වය (රු. 000)** | | | | |
| මුළු වත්කම් | 13,047,192 | 10,847,571 | 14,330,092 | 16968,920 |
| කොටස්කරුවන්ගේ අරමුදල | 1,459.950 | 1,346,767 | 1,131,546 | 414,522 |
| **සාමාන්‍ය ව්‍යාපාර කොටස්හි තොරතුරු (රු .000)** | | | | |
| කොටසක ඉපයුම | 12 | 22 | 21 | 10 |
| සඵල ලාභාංශ | 1.00 | 1.00 | -- | - |
| ශුද්ධ වත්කම් | 123 | 115 | | |



## 2.4 සමාගමේ පසුගියාව

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වර්ෂ 1872 ප්‍රථමයෙන් සමාගමක් ලෙස ලියාපදිංචි කොට ඇති අතර 1872 සිට 1976 දක්වා ශතවර්ෂයක කාලයක් මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර සිට පාලන කටයුතු සිදුකොට ඇති අතර 1976 ජනවාරි 14 දින 1971 අංක 35 දරණ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ ශ්‍රී ලංකා රජය විසින් ජනසතු කොට රජයට පවරාගත් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම නමින් නිසි බලධාරි කෙනෙකු යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

1987 අංක 23 දරණ රජයට පවරාගත් ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ රු. 10/- කොටස් 10,000,000 වන පරිදි රු. 100,000,000/- ප්‍රාග්ධනයක් සහිතව සම්පූර්ණ රාජ්‍ය සමාගමක් වශයෙන් ලියාපදිංචි කොට තිබේ.

පසුව 1994 ජුලි මස එවකට පැවති රජයේ ප්‍රතිපත්තියට අනුව මෙම සමාගම පෞද්ගලීකරණය කරන ලදුව කොටස් ප්‍රාග්ධනයෙන් 90% පෞද්ගලික සමාගමක් වෙත පවරන ලදි. ඉතිරි 10% සේවක සේවිකාවන් වෙත පැවරීමේ පදනම මත මහා භාණ්ඩාගාරය සතුව තබාගන්නා ලදි.

නැවතත් 1997 ජනවාරි 20 දින මෙම සමාගම රාජ්‍ය ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීමේ 1996 අංක 29 දරණ පණත යටතේ 90% කොටස් මහා භාණ්ඩාගාරය වෙත නැවත පවරාගන්නා ලදුව නිසි බලධාරි කෙනෙකු යටතේ රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පාලනය විය.

නැවත 2011 ජුනි 10 දින අධ්‍යක්ෂ මණ්ඩලයක පාලනය යටතට පත්කරන ලදි.

## 2.5 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල සිදුවීම්

- ප්‍රධාන පරිපාලන සංකීර්ණයක් හා ගබඩා සංකීර්ණයක් වත්තල හුණුපිටියේ ඉදිකිරීම ආරම්භ වීම.
- හම්බන්තොට වරාය ආසන්නයේ ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.
- ආයතනයේ සේවක සේවිකාවන්ගේ දැනුම හා හැකියාව උසස් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- තොරතුරු තාක්ෂණය ආයතනය තුල උපරිම අන්දමින් භාවිතා කිරීම සඳහා මූලික පියවර ගැනීම.
- දීර්ඝ කාලයක් තුල අඩුපාඩුවක්ව පැවති සේවක මණ්ඩල බඳවාගැනීමේ පටිපාටියක් සකස් කොට මහා භාණ්ඩාගාරයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම.

## 3. කළමණාකරණ විශ්ලේෂණය

දිවයිනෙහි වී වගාව වැඩිදියුණු කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ එන එක් ප්‍රධාන අනුසාංගයකි. මෙම උදාර ප්‍රතිපත්තිය යටතේ ප්‍රධාන පොහොර වර්ග තුන වන යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් මෙට්‍රික් ටොන් 01 ක් රු. 7,000/- බැගින් ගොවිජනතාවට බෙදාහැරීමට රජය තීරණය කරන ලදි.

යල සහ මහ කන්න වලදී රටෙහි වී වගාවට අවශ්‍ය පොහොර අවශ්‍යතාවය කෙතරම් දැයි අදාල පර්යේෂණ ආයතන වල නිර්දේශයන්ට අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් තීරණය කරනු ලබයි.

ඒ අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ මග පෙන්වීම මත මහින්ද චින්තන පොහොර සහනාධාර යෝජනා ක්‍රමය යටතේ, ගොවිජන සේවා මධ්‍යස්ථාන 557 හරහා ගොවිජනතාව වෙත පොහොර බෙදාහරිනු ලැබේ.

වර්ෂ 2010 දී අනෙකුත් භෝග සඳහා වූ පොහොරද සහනාධාර මිලකට ලක් කරනු ලදුව මෙට්‍රික් ටොන් 01 ක මිල රු. 24,000 කට ගොවීන් වෙත අලෙවි කරන ලදි.

රජය විසින් බලපවත්වන ලද පොහොර මිල පහත පරිදි වේ.

| | |
|---|---|
| සහනාධාර වී පොහොර | මෙ.ටොන් 01 ක් රු. 7,000/- බැගින් |
| සහනාධාර අනෙකුත් භෝග පොහොර | මෙ.ටොන් 01 ක් රු. 24,000/- බැගින් |
| සහනාධාර අනෙකුත් භෝග මිශ්‍ර පොහොර | මෙ.ටොන් 01 ක් රු. 26,000/- බැගින් |

ගිණුම් වර්ෂ 2012/13 සඳහා වූ වට්ටම්

ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් තීරණය කර ඇති පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් ලබාගන්නා වී පොහොර කිලෝග්‍රෑම් 50 බෑගයක් පහත සඳහන් මිල මත සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම නිකුත් කරනු ලැබේ.

- ආයතන විසින් සෘජුවම ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කරනු ලබන පොහොර සඳහා කිලෝග්‍රෑම් 50 බෑගයක් - රු. 330/-
- ප්‍රාදේශීය ගබඩාවේ සිට කි.මී. 30 ක දුර ප්‍රමාණයෙන් එහා පිහිටා ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා ප්‍රාදේශීය ගබඩාවට පැමිණ මිලදී ගැනුම් කිලෝග්‍රෑම් 50 බෑගයක් - රු. 314/-
- ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය සහිතව හුණුපිටිය ගබඩාවට පැමිණ මිලදී ගැනුම් සඳහා කිලෝග්‍රෑම් 50 බෑගයක් - රු. 290/-

රජය සතු වී වගාව සඳහා පොහොර බෙදාහරිනු ලබන ප්‍රධාන ආයතන දෙකෙන් එකක් ලෙස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ක්‍රියාත්මක වනු ලබයි. වී වගාව සඳහා අවශ්‍ය පොහොර වලින් 35% ක් බෙදාහැරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය අප සමාගමට අනුමැතිය දී ඇති අතර අප සමාගම අනෙකුත් භෝග සඳහා සීමිත පොහොර ප්‍රමාණයකින් නිකුත් කරන ලදි.

## 3.1 ව්‍යාපාරික සමාලෝචනය

පසුගිය වසර දෙක තුල වී වගාව සඳහා බෙදාහරිනු ලද පොහොර ප්‍රමාණ පහත පරිදි වේ.

| පොහොර වර්ගය | මුළු ප්‍රමාණය මෙ.ටොන් | |
|---|---|---|
| | ගිණුම් වර්ෂය 2012/13 | ගිණුම් වර්ෂය 2011/12 |
| යූරියා - වී | 79,017.350 | 90,593.700 |
| එම්.ඔ.පී - වී | 23,269.400 | 27,418.300 |
| ටී.එස්.පී - වී | 26,745.100 | 30,206.550 |
| | - | - |
| යූරියා - වෙනත් භෝග | 3,483.658 | 145.200 |
| එම්.ඔ.පී - වෙනත් භෝග | 471.903 | 81.775 |
| ටී.එස්.පී - වෙනත් භෝග | 1,706.699 | 68.673 |
| ඇමෝනියම් සල්ෆේට් | 15.590 | 0.105 |
| කීසරයිට් | 33.407 | 44.203 |
| සින්ක් සල්ෆේට් | 1.092 | 5.226 |
| මිශ්‍ර පොහොර | 41.495 | 83.603 |

**2012/13 මූල්‍ය වර්ෂය තුලදී දිස්ත්‍රික්ක අනුව සිදුකරන ලද විකුණුම්**

විකුණුම් ක්‍රියාවලිය දිවයින පුරා පිහිටි අපගේ උප ගබඩා 17 ක හරහා සිදු කරන අතර වැඩිම විකුණුම් ප්‍රමාණයක් වාර්තා කරන්නේ අම්පාර හා අනුරාධපුර දිස්ත්‍රික්ක තුළයි.



*දිස්ත්‍රික්ක අනුව විකුණුම් තොරතුරු (ප්‍රමාණය)*

| දිස්ත්‍රික්කය | පොහොර වර්ගය (මෙ.ටොන්) | | | එකතුව (මෙ.ටොන්) |
|---|---|---|---|---|
| | යුරියා | ටී.එස්.පී. | එම්.ඕ.පී. | |
| කොළඹ | 3,461 | 1,679 | 611 | **5,751** |
| ගම්පහ | 1,179 | 520 | 498 | **2,197** |
| කළුතර | 956 | 484 | 798 | **2,239** |
| නුවර | 416 | 159 | 135 | **711** |
| මාතලේ | 1796 | 579 | 494 | **2,870** |
| නුවරඑළිය | 241 | 104 | 105 | **450** |
| ගාල්ල | 663 | 323 | 567 | **1,554** |
| මාතර | 1,332 | 557 | 841 | **2,730** |
| හම්බන්තොට | 4,568 | 1,555 | 1,289 | **7,411** |
| කුරුණෑගල | 8,399 | 2,653 | 2,317 | **13,368** |
| පුත්තලම | 2,160 | 685 | 582 | **3,427** |
| රත්නපුරය | 1,415 | 495 | 475 | **2,385** |
| බදුල්ල | 2,919 | 1,077 | 885 | **4,881** |
| මොණරාගල | 3,964 | 1,303 | 1,091 | **6,359** |
| අනුරාධපුරය | 13,743 | 4,520 | 3,672 | **21,935** |
| පොළොන්නරුව | 6,680 | 2,218 | 1,862 | **10,760** |
| මඩකලපුව | 2,975 | 1,010 | 818 | **4,803** |
| අම්පාර | 13,959 | 4,737 | 3,746 | **22,442** |
| ත්‍රිකුණාමලය | 4,790 | 1,566 | 1,200 | **7,556** |
| වව්නියාව | 1,809 | 585 | 446 | **2,841** |
| මුලතිව් | 1,083 | 350 | 277 | **1,710** |
| මන්නාරම | 1,967 | 701 | 512 | **3,181** |
| කිලිනොච්චි | 1,839 | 507 | 437 | **2,782** |
| කෑගල්ල | 186 | 83 | 85 | **354** |
| එකතුව | **82,501** | **28,452** | **23,741** | **134,694** |

### 3.2 ආයතනික ව්‍යුහය හා බෙදාහැරීමේ ජාලය

අලෙවි කරනු ලබන පොහොර වල මිල සහ ප්‍රමාණය නිශ්චිත හෙයින් ආයතනයේ ලාභ අපේක්ෂාවන් බහුතරවම රදාපවතින්නේ ආයතනික ව්‍යුහය හා බෙදාහැරීමේ ජාලය මතය.

සමාගමේ කාර්ය මණ්ඩලය



### 3.3 සැපයුම් දාම කළමණාකරණය

සැපයුම් දාමයේ මෙහෙයුම් සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම, පාලනය කිරීම සහ සුපරීක්ෂණය සැපයුම් සහ නාවික කළමණාකරු සිදුකරයි. පොහොර ආනයනය සහ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ ඊට අදාල සියළුම සැපයුම් කරුවන්, හා අනෙක් රාජ්‍ය අංශ ආයතන සම්බන්ධීකරණය කළමණාකරණය කිරීම ඔහුගේ වගකීමයි.

සැපයුම් දාම උපාය මාර්ග තුල කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි ප්‍රධාන අරමුණ නම් එකිනෙකට සරිලන දාමයන් කාර්යක්ෂමව එකිනෙකට සම්බන්ධ කරගැනීමත් එතුලින් පිරිවැය, අනවශ්‍ය වියදම් පහත හෙලා පාරිභෝගික තෘප්තිය උපරිම කොට අවසාන වශයෙන් ගොවි ජනතාව තෘප්තිමත් කිරීමය.

සැපයුම් දාම කළමණාකරණ ප්‍රවාහය



## ප්‍රාදේශීය ගබඩාවන්හි බෙදාහැරීමේ ජාලය



## 3.4 මිනිස් ශ්‍රම ප්‍රාග්ධන දර්ශකය

සමාගමෙහි සේවක සේවිකාවන් මානව ප්‍රාග්ධනය ලෙස සලකනු ලබයි. වැඩ බිම තුලින් ඉල්ලුම් කරන ශ්‍රම බලකාය අප සමාගම ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු කරගෙන ඇත.




## 3.5 මිනිස් ශ්‍රම ප්‍රාග්ධන මූල්‍ය සමාලෝචනය

| වර්ෂය | 2012/13 | 2011/12 | 2010/11 | 2009/10 |
|---|---|---|---|---|
| සේවකයෙකුගේ සාමාන්‍ය ආදායම (රු. 000) | 6,719 | 7,497 | 8,994 | 8,113 |
| සේවකයෙකුගේ සාමාන්‍ය ලාභය (රු. 000) | 956 | 1,652 | 1,770 | 943 |
| සේවක සංඛ්‍යාව | 129 | 131 | 119 | 113 |

## 3.6 මානව සම්පත්හි දැනුම වර්ධනය සඳහා යොදාගත් වැඩසටහන්

| පුහුණුව | පුහුණුව ලබා දුන් ආයතනය | සහභාගි වූ සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත යොදාගැනීම | බී.ආර්.ඩී. සිල්වා සහ සමාගම (වරලත් ගණකාධිකාරී) | 06 |
| | | |
| | | |

## 4. මූල්‍ය වාර්තාකරණය

### 4.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

අපගේ නිෂ්පාදන

කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි නාමය ගොවි ජනතාව තුල ප්‍රචලිත කරමින් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සියවසකටත් අධික කාලයක් නොවෙනස්ව ගොවි ජනතාවට සේවා සපයමින් සිටියි. වර්තමානයේ අපගේ ප්‍රධාන කාර්යය වනුයේ සහනාධාර පොහොර නිසි කලට ගොවි ජනතාවට ලබාදීමය.

ගොවි ජනතාව තුල 'කොමර්ෂල් පොහොර' යන සන්නම් නාමය යටතේ අප සමාගමෙහි නාමය ප්‍රචලිතව ඇති අතර කොමර්ෂල් පොහොර නාමය යටතේ රටේ වී පොහොර අවශ්‍යතාවයෙන් 35% ක් බෙදා හරිනු ලබයි. වී ගොවිතැන සඳහා පොහොර බෙදාහැරීමට අමතරව තේ, පොල්, එළවළු හා අනෙක් සුළු අපනයන භෝග සඳහාද සැලකිය යුතු ප්‍රමාණයකින් පොහොර සැපයීමද අප සමාගම සිදු කරනු ලැබේ.

අපගේ ශක්තිය

ආයතනයේ වර්ෂ 2011-2016 දක්වා වූ සංයුක්ත සැලැස්ම සහ වර්ෂ 2012-2015 දක්වා වූ මෙහෙයුම් සැලැස්ම රටේ පොහොර අවශ්‍යතාවය පදනම් කොට ගෙන ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ සහය ලබාගනිමින් පිළියෙල කර ඇත. මෙයට අමතරව වාර්ෂික පොහොර බෙදාහැරීමේ සැලැස්මද ජාතික පොහොර ලේකම් කාර්යාලයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහය සහිතව සමාගමේ සියළුම අභිප්‍රායන් තෘප්ත වන පරිදි සකසා ඇත.

වර්ෂය තුල අපගේ ජයග්‍රණයන්

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සිය මූල්‍ය වාර්තාවන් අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරයි.

2012/13 ගිණුම් වර්ෂය තුල අප සමාගම වර්ග අඩි 10,000 ක භූමි ප්‍රමාණයකින් යුත් නවීන පහසුකම් වලින් සැදුම් ලත් නව කාර්යාල සංකීර්ණයක් සහ වර්ග අඩි 25,000 ක භූමි ප්‍රමාණයකින් යුත් නව ගබඩා සංකීර්ණයක් ගොඩනැගීමේ කර්තව්‍යයෙහි නියැලි සිටි අතර මෙම ගොඩනැගිලි වර්ෂ 2013 හි ඔක්තෝම්බර් මස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ අතිගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා අතින් විවෘත කරන ලදි.

සමාගමෙහි ස්ථිර සේවක ධුරාවලිය සහ බඳවා ගැනීමේ පටිපාටිය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලබාගෙන හඳුන්වා දී ඇත. සේවකයන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරිමේ අරමුණ පෙරදැරිව කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීමට සමාගම කටයුතු සූදානම් කර ඇත.

2012/13 ගිණුම් වර්ෂය තුල සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමට සිය ශුද්ධ ජංගම වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 1,039 තෙක් ඉහල නංවා ගතහැකි විය. මෙම මූල්‍ය කාලච්ඡේදය තුල සමාගම රු. මිලියන 182 ක බදු පෙර ලාභයක් උපයාගෙන ඇත. මෙය 2011/12 ගිණුම් වර්ෂය තුලදි රු.මිලියන 314 ක් වූ අතර 2012/13 වර්ෂය තුල හට ගත් රුපියල් මිලියන 104 ක විදේශ විනිමය හුවමාරු අලාභය මෙම බදු පෙර ලාභ විචලනයට බලපාන ලදි.

ලාභාංශ

අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය පරිදි 10% ක ලාභාංශ ගෙවීමට තීරණය කරන ලදි. වර්ෂය තුල ගෙවන ලද ලාභාංශ රු.මිලියන 10කි.

අපගේ අනාගත දැක්ම

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සිය ව්‍යාපාර අරමුණු කාර්යක්ෂමව සාක්ෂාත් කර ගැනීම සඳහා පරිගණක ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ කටයුතු ආරම්භ කොට තිබේ. මෙම ක්‍රමවේදය 2014/15 මූල්‍ය වර්ෂය තුල ක්‍රියාත්මක කරවීමට සැලසුම් කර ඇත.

අපගේ ආයතනික යහපාලනය

මෙම මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇත.

සියළුම සේවක බඳවාගැනීම් සහ උසස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදුකරනු ලබයි.

සියළුම ප්‍රතිපත්තිමය තීරණයන් සහ පුළුල් උපාය මාර්ගයන් සකසනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා කිරීම් වලින් අනතුරුවය.

සියුම් ලෙස පරීක්ෂණයට ලක් කල යුතු සියළුම වැදගත් විෂයන් කළමණාකරණ කමිටුව හරහා ආමන්ත්‍රණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.

කාර්යක්ෂම හා ඵලදායි මෙහෙයුම් ප්‍රතිඵල ලබාගැනීම සඳහා ජොෂ්ඨ කළමණාකරණ කමිටුව විසින් විස්තරාත්මක වැඩ සටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි.

**එන්.එස්.එම්.සම්සුදීන් මයා (නීතිඥ)**
*සභාපති*

**ඩී.විජේරත්න මයා**
*විධායක අධ්‍යක්ෂ*

**රෝහණ අල්විස් මයා**
*අධ්‍යක්ෂ*

**එන්.පී.අමරතුංග මයා**
*අධ්‍යක්ෂ*

**ප්‍රියංගනී ලියනගේ මයා**
*අධ්‍යක්ෂ*

**එස්.එම්.ඩබ්.කොරසගල්ල මයා (නීතිඥ)**
*අධ්‍යක්ෂ*

**ටී.එම්.කේ.තෙන්නකෝන් මයා (නීතිඥ)**
*අධ්‍යක්ෂ*

**එස්.පී.මොරවක මයා (නීතිඥ)**
*සමාගම් ලේකම්*

## අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරණ සමාගම් පනතේ අංක 150(1) සහ 151 වගන්තීන්ට අනුව එහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සෑම මූල්‍ය වර්ෂයක්ම සඳහාම සමාගමේ කටයුතු සහ සමාගමේ විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සත්‍ය හා සාධාරණත්වය පිළිබිඹු වන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට අධ්‍යක්ෂකවරුන් වගකිව යුතුය.

මූල්‍යමය තත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් තීරණය කිරීමට ඉවහල් වන පරිදි විධිමත් ලේඛණ පවත්වාගෙන යන බවට, මූල්‍ය ප්‍රකාශණ සකස් කරන බවට සහ එම ප්‍රකාශණ සම්බන්ධයෙන් විගණන නියමාකාරයෙන් සිදුවන බවට අංක 148 වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශ වල අවංකභාවය හා වාස්තවිකතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනී. මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේදී ගණුදෙණු වල ස්වරූපය හා අන්තර්ගතය නිසි අයුරින් පිළිබිඹු වන සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට එළඹෙමින් උචිත ගිණුම් ප්‍රතිපත්ති සංගතතාවයකින් යුතුව තෝරාගෙන භාවිතා කළ බවට අධ්‍යක්ෂවරු සහතික කරති.

මෙම මූල්‍ය ප්‍රකාශණ 2007 අංක 07 දරණ සමාගම් පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන ලද බවටද අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරති.

තවද මෙම මූල්‍ය ප්‍රකාශණ සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරනු ලබන අතර. අධ්‍යක්ෂවරුන් තමන් සතු සමාගම පිළිබඳ දැනුම, ප්‍රධාන මෙහෙයුම් හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ නිශ්චිත තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශණ එම පදනම මත පිළියෙල කර ඇත.

සමාගමේ වත්කම් සුරුකීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුබුන්වත්භාවය පිළිබඳව පරීක්ෂාවෙන් සාර්ථකව ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමකට පත්වී, සමාගම් පනතේ අංක 56(2) වගන්තිය අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති අතර, යෝජිත ලාභාංශ සම්බන්ධයෙන් නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශණයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ගේ මතය පිටු අංක 20 හි සඳහන්ය.

අනුකූලතා වාර්තාව

සමාගමේ සේවකයන් හා රජයට අදාලව සමාගමෙන් එහි පරිපාලිත සමාගම් වලින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනය වන විට ගෙවීමට නියමිත සියලුම නීති ප්‍රකාර ගෙවීම් සියලුම උපරිම දැනුම අනුව ගෙවා නිමකර ඇති බව හෝ අදාල පරිදි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

එස්. පී. මොරවක
සමාගම් ලේකම්,
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි
සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

## සභාපතිවරයාගේ හා මුල්‍ය කළමණාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2013 මාර්තු 31 දිනට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මුල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලබනුයේ පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූලවය.

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුක්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන් සංග්‍රහය

මුල්‍ය ප්‍රකාශණවල, සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මුල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේදී උපයෝගි කර ගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යොදා ගත් බව අපි සනාථ කරමු. කිසිම අපගමනයකින් තොරව නිවැරදි ගිණුම් ප්‍රමිතීන් යොදා ගෙන තිබේ. ඉහල මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කමිටුව සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදි.

වත්කම් සුරැකීමේ. වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ හා අනාවරණය කරගැනීමේ අරමුණෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛණ ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියටද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, ඇගයුමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින් කලට කරන ලද විගණන තුලින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා පටිපාටි නිරන්තරයෙන්ම අනුගමනය වී තිබෙන බවට සාධාරණ සහතික වීමක් සැලසී ඇත. එසේ වුවද ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුලින් සැලසෙන සහතික වීම් කර බැලීමේදී හඳුනාගත යුතුවූ ආවේනික සීමාවන් තිබේ.

විගණනවල සඵලතාවය සමාලෝචනය කිරීමටත්, විගණනය කිරීම, අභ්‍යන්තර පාලනය හා මුල්‍ය වාර්තාකරණයේ ගැටලු ගැන සාකච්ඡා කිරීමටත් සමාගමේ විගණන කමිටුව කලින් කලට අභ්‍යන්තර විගණකයින්ට හා බාහිර විගණකයින්ට පූර්ණ හා නිදහස් අවසරය දී තිබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ විගණකාධිපති තුමා විසින් මුල්‍ය ප්‍රකාශ විගණනය කරන ලදි.



.......................................
එන්. එස්. එම්. සම්සුදීන්
සභාපති



.......................................
එච්. එන්. ආරියදාස
මුදල් කළමණාකරු

## සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

----------------------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

--------------

1.1.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 මාර්තු 31 දිනට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.1.2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වීම

--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151(2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

-----------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී. /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුල මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කලයුතු වුවත් 2012/2013 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන මාස 05 ක ප්‍රමාදයකින් පසුව 2013 නොවැම්බර් 01 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි.

1.2.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

---------------------------------------------------------

සමාගමේ ප්‍රධාන කාර්යාලය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 77.314 ක පිරිවැයකට ඉදිකිරීමට අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබූ නමුත් 2011 ජුනි 22 පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාගමේ කාර්යයන් සැලකිල්ලට ගෙන නව ගොඩනැගිල්ලක අවශ්‍යතාවයක් නොමැති බව දක්වා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණි. එම තීරණයන්ගෙන් බැහැරව ප්‍රධාන කාර්යාලය සඳහා 2012 ජුනි 22 දින තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ රුපියල් මිලියන 49.666 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර විගණන දිනය වූ 2013 ජුනි 30 වන විට මේ ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 38.795 ක් වැය කර තිබුණි.

**2.** මූල්‍ය සමාලෝචනය

--------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම් වලින් රු.**181,928,588** ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. **314,143,499** ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.**132,214,911** ක අඩුවීමක් නිරීක්ෂණය විය.

**2.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල විවිධ අදියරයන් යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|
| | **2013** | **2012** |
| | රු. | රු. |
| දළ ලාභය | 208,324,888 | 169,316,076 |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | 181,928,588 | 314,143,499 |
| බදු වලට පසු ශුද්ධ ලාභය | 123,182,723 | 216,412,432 |

සමාගමේ විකුණුම් සියයට **12** කින් අඩුවීම සහ මූල්‍ය පිරිවැය සියයට **62** කින් වැඩිවීම ලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.**103,676,072** ක විනිමය අලාභයක් ඇති වීම නිසා විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට **308** කින් ඉහළ ගොස් තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) වර්ෂ කිහිපයක සිට ප්‍රාදේශිය ගබඩාවන් 08 ක ගබඩා කර තිබූ පළුදු වූ පොහොර මළු නැවත මළුගත කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) බොහෝ ප්‍රාදේශිය ගබඩාවන්හි පොහොර තොග සඳහා ස්වාභාවික ආපදාවන්ගෙන් සිදුවන හානි අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශිය ගබඩාවන් වෙත ඉදිරිපත් කරනු ලබන ඇණවුම් නිල මුද්‍රා තබා සහතික කර නොතිබූ අවස්ථා හා ඇණවුම් ඉදිරිපත් කර නොමැති විටද පොහොර නිකුත් කර තිබුණු අවස්ථා ද නිරීක්ෂණය වුයෙන් ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය දූර්වල තත්ත්වයක පැවතුණි.

(ඈ) ප්‍රවාහන ගාස්තු ගෙවීමේදී නියමිත දුර ප්‍රමාණයට වඩා වැඩි දුර ප්‍රමාණයක් දක්වා රු.31,696,909 ක් වැඩිපුර ගෙවීම හා පෞද්ගලික ආයතනයකට පොහොර නිකුත් කිරීමෙන් රු.3,771,411 ක පාඩුවක් සිදුවීම යන මුල්‍යමය අලාභ හානි හා විෂමාචාරයන් සිදුකිරීම නිසා සමාගමේ අලෙවි කළමනාකරුවෙකුගේ සේවය 2011 පෙබරවාරි 01 දින සිට අත්හිටුවා තිබුණද එම මුල්‍යමය අලාභයන් අයකර ගැනීමට අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-------------------------------------

2012 වර්ෂයේ පොහොර ප්‍රවාහන කොන්ත්‍රාත් ප්‍රදානය

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 5.4.8 (අ), (ආ) ඡේදයන් අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ට නොඅඩු හා ටෙන්ඩර් කාලසීමාව ඉක්මවා දින 28 ක් දක්වා වලංගු වන කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත් පොහොර

ප්‍රවාහනය සඳහා තෝරාගෙන තිබුණු ආයතන 02 කින් කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8 වන පරිච්ඡේදයේ 8.9.1 අනුව රු.500,000 ඉක්මවන සේවා ගිවිසුමක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකු සමඟ විධිමත් ගිවිසුම්වලට එළැඹී නොතිබුණි.

3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සාප්පු හා කාර්යාල සේවක පනතට පටහැනිවීම්

---------------------------------------------------------------------------

(i) පනතේ 6 වන වගන්තිය අනුව වාර්ෂික නිවාඩු දින 14 ක් හා අනියම් නිවාඩු දින 07 ක්ද හිමිවන බව දක්වා ඇතත්, සමාගම විසින් සේවකයින් සඳහා අනියම් නිවාඩු 21 ක් හා වෛද්‍ය නිවාඩු 21 ලෙස දින 42 ක නිවාඩු සඳහා ඉඩදී, ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා රු.2,851,258 ක් කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

(ii) පනතේ 17 වන වගන්තිය අනුව සෑම සේවකයෙක් වෙනුවෙන්ම වැඩකළ පැය ගණන් හා අතිකාල සේවාවන් වෙනුවෙන් වාර්තා තබාගැනීම හා සෑම සේවකයකු වෙනුවෙන්ම විස්තර ඇතුලත් වැටුප් ලේඛනයක් තබාගැනීම කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලය සඳහා අතිකාල ගෙවීම හා ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් කිරීමේදී මූලික වැටුප පදනම් කරගෙන ගෙවීම් කළයුතු නමුත් සමාගම සියලු දීමනා ඇතුලත් දළ වැටුප මත අතිකාල දීමනා ගණනය කිරීම හේතුවෙන් නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙවීම්කර තිබුණි.

3.4 වාහන උපයෝජනය

---------------------------

සමාගමේ වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් පත්‍රිකාවල ඉන්ධන ගැලපුම් ගිණුම් පිළියෙල නොකිරීම, රියදුරන්ගේ නම හා අත්සන යොදා නොතිබීම, ලීටරයට ධාවනය වන දුර ප්‍රමාණය තීරණය නොකිරීම, ඇතැම් ධාවන සටහන්වල ගමන් කල නිලධාරියා හා අත්සන නොමැතිවීම ආදී කරුණු

හේතුවෙන් වාහන ධාවනය පිළිබඳ නිසි අභ්‍යන්තර පාලනයක් පැවැත්වීමට සමාගම අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

**4.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

**4.1** වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------

සමාගමේ 2011/12 මුල්‍ය වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2014 ජනවාරි 13 වන විටද පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**4.2** පොදු ව්‍යාපාර කාරක සභාව දුන් නියෝග ඉටු නොකල අවස්ථා

------------------------------------------------------------

2012 ජුලි 05 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සමාගම සඳහා භාණ්ඩාගාර අනුමත දිරි දීමනා පරිපාටියක් පිළියෙල කර ගැනීමේ අවශ්‍යතාව දක්වා තිබුණත් 2013 දෙසැම්බර් 31 දක්වා එම පරිපාටිය පිළියෙල කර නොතිබුණි.

**5.** පද්ධති හා පාලනය

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලිය

(ආ) තොග පාලනය

(ඇ) වවුචර් පිළියෙල කිරීම, සහතික කිරීම, ගෙවීම් සටහන් කිරීම

(ඈ) ප්‍රසම්පාදනය

(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| ආදායම | 13 | 866,809,058 | 982,118,071 |
| සහනාධාරය මත විකුණුම් පිරිවැය | 14 a | 8,385,934,065 | 9,022,943,917 |
| විකුණුම් පිරිවැය | 14 b | (9,044,418,235) | (9,835,745,912) |
| දළ ලාභය | | 208,324,888 | 169,316,076 |
| සහනාධාරය මත පොදු කාර්ය පිරිවැය | 14 c | 190,388,603 | 206,843,175 |
| වෙනත් ආදායම් | 15 | 21,234,145 | 31,105,688 |
| | | 419,947,636 | 407,264,940 |
| පරිපාලන වියදම් | | (77,979,300) | (73,359,044) |
| බෙදාහැරීමේ වියදම් | | (154,471,085) | (37,887,395) |
| වෙනත් වියදම් | | (3,810,241) | (1,937,512) |
| මෙහෙයුම් ලාභය | | 183,687,010 | 294,080,988 |
| ශුද්ධ මුල්‍ය පිරිවැය | 16 | (1,758,422) | 20,062,511 |
| මුල්‍ය ආදායම | 16.a | (62,511,226) | (59,820,500) |
| මුල්‍ය වියදම | 16.b | 64,269,648 | 39,757,989 |
| බදු පෙර ලාභය | 17 | **181,928,588** | **314,143,499** |
| ආදායම් බදු | 18 | (58,745,864) | (97,731,067) |
| බදු පසු ශුද්ධ ලාභය | | **123,182,723** | **216,412,432** |
| කොටසක මූලික ඉපයුම | 19 | 12.32 | 21.64 |
| වෙනත් විස්තීරණ ආදායම් | | | |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | **123,182,723** | **216,412,432** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)

# 2013 මාර්තු 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2012/2013 | 2011/2012 | 2010/2011 |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | **Rs.** | **Rs.** | **Rs.** |
| දේපල පිරියත හා උපකරණ | 20 | 223,942,057 | 208,808,059 | 209,886,592 |
| ප්‍රාග්ධන නොනිම් වැඩ | 21 | 29,191,969 | 12,153,192 | 413,001 |
| | | **253,134,026** | **220,961,251** | **210,299,594** |
| ජංගම වත්කම් | | | | |
| තොගය | 23 | 184,649,069 | 165,784,382 | 196,757,936 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 24 | 11,960,848,352 | 9,671,176,077 | 12,947,440,049 |
| ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ | 25 | - | 2,394,734 | 2,675,239 |
| සේවක ණය හා අත්තිකාරම් | 26 | 11,401,972 | 15,017,379 | 582,290 |
| තැන්පතු හා අත්තිකාරම් | 27 | 7,564,046 | 11,449,481 | 19,867,162 |
| අනෙකුත් මුල්‍ය වත්කම් | 28 | 294,331,756 | 464,694,252 | 436,672,463 |
| බැංකු හා අතැති මුදල් | 29 | 335,262,627 | 296,093,770 | 515,797,182 |
| මුළු ජංගම වත්කම් | | **12,794,057,823** | **10,626,610,074** | **14,119,792,320** |
| මුළු වත්කම් | | **13,047,191,849** | **10,847,571,325** | **14,330,091,914** |
| හිමිකම් සහ වගකීම් | | | | |
| ප්‍රාග්ධන හා සංචිත | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 30 | 100,000,000 | 100,000,000 | 100,000,000 |
| ප්‍රාග්ධන සංචිත | 31 | 1,683,685 | 1,683,685 | 1,683,685 |
| පිළිසකරණ හා ප්‍රත්‍යාගණන සංචිත | 32 | 288,947,577 | 288,947,577 | 290,147,577 |
| රඳවා ගත් ලාභ | | 1,069,318,320 | 956,135,597 | 739,714,490 |
| | | **1,459,949,582** | **1,346,766,858** | **1,131,545,752** |
| ජංගම නොවන වගකීම් | | | | |
| සේවක පාරිතෝෂික බැඳීම | 33 | 6,421,801 | 8,996,424 | 7,418,966 |
| විලම්භිත බදු | 34 | 20,385,523 | 11,620,485 | 6,776,244 |
| පොළී සහිත ණය | 35 | | | 3,586,937,069 |
| | | 26,807,324 | 20,616,909 | 3,601,132,279 |
| ජංගම වගකීම් | | | | |
| පොළී සහිත ණය | 35 | 10,715,949,860 | 3,586,937,069 | 4,800,982,988 |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 36 | 527,107,610 | 5,554,246,656 | 4,356,136,052 |
| ගෙවිය යුතු ලාභාංශ | 37 | 10,000,000 | 8,000,000 | - |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 38 | 15,602,676 | 21,070,351 | 23,576,321 |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | 39 | 273,083,253 | 288,129,977 | 395,900,924 |
| උපචිත වියදම් | 40 | 18,691,544 | 21,803,504 | 20,817,599 |
| මුළු ජංගම වගකීම් | | **11,560,434,943** | **9,480,187,558** | **9,597,413,884** |
| මුළු හිමිකම හා වගකීම | | **13,047,191,849** | **10,847,571,325** | **14,330,091,914** |

**2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශතා වලට අනුකූලව මුල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇති බැව් සහතික කරමි. පිටු අංක 07 සිට 41 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මුල්‍ය ප්‍රකාශණ වල කොටසක් වශයෙන් සැලකිය යුතුය.**

……………………………

**මුදල් කළමණාකරු**

**මෙම මුල්‍ය ප්‍රකාශ පලකර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.**

**අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කලේ**

……………………………… ………………………………

**සභාපති** **අධ්‍යක්ෂක**

**දිනය 2014 මැයි 23**

**කොළඹදීය.**

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීමේ ප්‍රකාශය

| | කොටස් ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අයභාර සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2011-04-01 දිනට ශේෂය (පෙර පැවති)** | 100,000,000 | 1,683,685 | 30,691,298 | 290,172,577 | 768,443,422 | 1,190,990,981 |
| ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ගේ මුල්වරට භාවිතයේ බලපෑම. | - | - | (30,691,298) | (25,000) | (28,728,932) | (2,587,494,537) |
| **2011-04-01 දිනට ශේෂය (නිවැරදි කල)** | **100,000,000** | **1,683,685** | **-** | **290,147,577** | **739,714,490** | **(1,396,503,556)** |
| | | | | 290,147,577 | **742,541,544** | **(1,393,676,502)** |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | | - | - | - | 3,546,273 | 3,546,273 |
| ලාභාංශ | - | - | - | - | (10,000,000) | (10,000,000) |
| ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ගේ මුල්වරට භාවිතයේ බලපෑම. | - | - | | (1,200,000) | 6,462,402 | 5,262,402 |
| කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/(අලාභය) | | - | - | - | 216,412,432 | 216,412,432 |
| **2012-03-31 දිනට ශේෂය** | **100,000,000** | **1,683,685** | **-** | **288,947,577** | **956,135,597** | **(1,181,282,449)** |
| කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/(අලාභය) | | | | | 123,182,723 | 123,182,723 |
| ලාභාංශ | - | - | - | - | (10,000,000) | (10,000,000) |
| | | | | | | - |
| **2013-03-31 දිනට ශේෂය** | **100,000,000** | **1,683,685** | **-** | **288,947,577** | **1,069,318,320** | **(1,068,099,726)** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)

| | | 2013 | 2012 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලා ඒම | | 181,928,588 | 314,143,499 |
| බදු පෙර ලාභය | | | |
| *ගැලපීම් ;* | | | |
| ක්ෂය වීම් | | 15,358,640 | 11,981,743 |
| ලාභාංශ සඳහා වෙන්කිරීම | | - | 8,000,000 |
| සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම | | 517,835 | 1,645,143 |
| ආරම්භක ශේෂය සඳහා ගැලපීම | | - | 3,661,031 |
| පොළී ආදායම | | (62,511,226) | (59,820,500) |
| පොළී වියදම | | 64,269,648 | 39,757,989 |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය | | **199,563,484** | **319,368,904** |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම | | | |
| තොගය | | (18,864,688) | 30,973,554 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | (2,289,672,276) | 3,276,263,972 |
| තැන්පතු හා අත්තිකාරම් | | 3,885,435 | 8,417,681 |
| සේවක ණය හා අත්තිකාරම් | | 3,615,407 | (14,435,089) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | (5,027,139,046) | 1,198,110,604 |
| ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ | | (2,247,564) | 280,505 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | | (5,467,675) | (2,505,969) |
| උපචිත වියදම් හා වෙන් කිරීම් | | (3,111,961) | 985,905 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | **(7,139,438,883)** | **4,817,460,067** |
| ගෙවූ පාරිතෝෂික | | (3,092,458) | (67,685) |
| ගෙවූ පොළී | | (64,269,648) | (39,757,989) |
| ගෙවූ බදු | | (60,385,251) | (204,310,129) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(7,267,186,241)** | **4,573,324,264** |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලා ඒම | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | | (30,492,638) | (12,103,209) |
| කාරක ප්‍රාග්ධන ආයෝජනය | | (17,038,777) | (11,740,191) |
| අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජනය | | 170,362,495 | (28,021,789) |
| පොළී ලැබීම් | | 62,511,226 | 59,820,500 |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | **185,342,307** | **7,955,311** |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | | |
| වර්ෂය තුල ලාභාංශ ගෙවීම් | | (8,000,000) | - |
| වර්ෂය තුල ණය ගැනුම් | | 10,715,949,860 | - |
| වර්ෂය තුල ණය පියවීම | | (3,586,937,069) | (4,800,982,988) |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **7,121,012,791** | **(4,800,982,988)** |
| වර්ෂය තුලදී මුදල් හා මුදල් වලට සමාන දැහි වෙනස් වීම | | **39,168,857** | **(219,703,412)** |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ | | 296,093,770 | 515,797,182 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ | සටහන 31 | **335,262,627** | **296,093,770** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

# 1 සංස්ථා තොරතුරු

## 1.1 ආයතන වාර්තාව

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සීමිත වගකීමකින් යුත් සමාගමක් වන අතර 04-10-1989 දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලදුව 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ 15-07-2011 දින ලියාපදිංචි කල රජය සතු නේවාසික සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වත්තල හුණුපිටිය ලිපිනයෙහි පිහිටා ඇත.

## 1.2 සමාගම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් භෝග සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරණය සිදු කරයි.

## 1.3 මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය

මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. 2014 මැයි 23 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවෙන් 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

## 1.5 සේවක සංඛ්‍යාව

සමාගමේ සේවක සංඛ්‍යාව

| 2013 මාර්තු 31 දිනට | | 2012 මාර්තු 31 දිනට | |
|---|---|---|---|
| • විධායක කාර්ය මණ්ඩලය | - 18 | • විධායක කාර්ය මණ්ඩලය | - 22 |
| • ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩලය | - 98 | • ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩල | - 79 |
| • කම්කරුවන් | - 10 | • කම්කරුවන් | - 15 |
| | 126 | | 116 |

# 2. පිළියෙල කිරීමේ පදනම

## 2.1 ප්‍රකාශයේ අනුමැතිය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරන ලද්දේ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

සමාගම විසින් මූල්‍ය වාර්තා 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයද ඇතුලත්ව 2011 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට භාවිතයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2013 මාර්තු 31 දිනට ප්‍රථම වාර්ෂික මූල්‍ය ප්‍රකාශණය පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය මගින් ඉදිරිපත් කල ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සමග ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත බොහෝ සෙයින් සමානය.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට භාවිතයෙන් මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට මාරු වීමෙන් මූල්‍ය තත්වයට, මූල්‍ය ක්‍රියාකාරිත්වයට, මුදල් ප්‍රවාහයන්ට සිදු වූ බලපෑම මෙම මූල්‍ය වාර්තා වල සටහන් 46 හි දක්වා ඇත.

## 2.2 ඇගයීමේ පදනම

පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය තත්ව ප්‍රකාශණය ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

- ඉඩම් හා ගොඩනැගිලි
- ලාභාලාභ තුලින් සාධාරණ මිලට මණිනු ලබන මූල්‍ය සාධන පත්‍ර
- ආයුගණක ඇඟයීමෙන් පසු වාර්තා කළ නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් වර්තමාන අගයට

## 2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කරනු ලබන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ප්‍රධාන මුදල් ඒකකයද වේ. සෑම මූල්‍ය තොරතුරක්ම ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආසන්නතම රුපියල් අගයට වටයා ඇත.

**2.4** ඇස්තමේන්තු, නිශ්චය කිරීම් සහ උපකල්පනයන් භාවිතය

ශ්‍රී.ලං.ගි.ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේදී ගිණුම් ප්‍රතිපත්ති භාවිතයට සහ වත්කම් බැරකම් ආදායම් සහ වියදම් වලට බලපාන ඇස්තමේන්තු, තීරණ සහ උපකල්පනයන් කිරීමට කළමනාකාරිත්වයට අවශ්‍යවේ. සත්‍ය ප්‍රතිඵල ඇතැම් විට ඇස්තමේන්තු අගයට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ මූලික උපකල්පනයන් අඛණ්ඩව විචාරනු ලැබේ. ගණකාධිකරණ ඇස්තමේන්තුමේන්තු සඳහා වූ සංශෝධන, එම සංශෝධන සිදුකළ කාළ පරිච්ඡේදයේදී සහ ඒවා බලපාන අනාගත කාළ පරිච්ඡේදයන් වළදී හඳුනාගනී.

**2.4.1** දේපළ. පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය

සමාගම එහි ඉඩම් ප්‍රත්‍යාගණන අගයට ඉදිරියට ගෙනයනු ලැබේ. සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීරණ ආදායමට හඳුනා ගැනේ. සමාගම 2007.03.12 දිනට සාධරණ අගය තීරණය කිරීමට රජයේ තක්සේරුකරු යොදා ගනි. ඉඩම් පිළිබඳ තවදුරටත් තොරතුරු සටහන් අංක 20 හි විස්තර කෙරේ.

**2.4.3** විශ්‍රාමික ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි පිරිවැය ආයුගණක ඇඟයීමෙන් තීරනය කරණු ඇත. ආයුගණක ඇඟයීමට ඇතැම්විට අනාගත සත්‍ය වර්ධනයන්ට වඩා වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් යොදා ගැනේ. වට්ටම් ප්‍රතිශතයන්, අනාගත වැටුප් වර්ධක සහ මර්ත්‍යතාවය මෙම උපකල්පනයන් වේ. ඉහත උපකල්පනයන් අගය කිරීමේ ඇති සංකීර්ණභාවය සහ ඒවායෙහි කල්පැවැත්මෙහි ස්වභාවය හේතුවෙන් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාමික වගකීම මෙම උපකල්පනයන්හි විචලතාවයන් සඳහා ඉතා සංවේදී වේ. මෙම සියලු උපකල්පන වාර්ථා කරන දිනට අභයනු ඇත.

**2.4.4** මූල්‍ය සාධන පත්‍ර වල සාධාරණ මිල

මූල්‍ය තත්ව ප්‍රකාශණයන්හි මූල්‍ය වත්කම් බැරකම් වල සාධාරණ මිල වාර්තා කරන විට සක්‍රිය වෙළඳ පොලින් උකහා ගත නොහැකිනම් ඒවායේ සාධාරණ මිල වට්ටම් කළ මුදල් ප්‍රවාහ ආකෘතීන් ඇතුලු ඇගයීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් තීරණය කෙරේ. හැකි විට මෙම ආකෘතීන්ට අවශ්‍ය යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වෙළඳ පොලින් ගනු ලැබේ. නමුත් මෙය ශක්‍ය නොවන විට සාධාරණ මිල තහවුරු කිරීමට යම් මට්ටමක නිශ්චයක් අවශ්‍ය වේ. නිශ්චයන්හි ද්‍රවශීලතා අවධානම, ණය අවධානම සහ මෙම සාධක සම්බන්ධ උපකල්පනයන්ගේ වෙනස් වන ස්වභාවය මූල්‍ය ප්‍රකාශන්හි වාර්ථා කර ඇති සාධාරණ මිලට බලපෑම් කරයි.

**3.** වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

වෙනස් ආකාරයෙන් දක්වා නැතිනම් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සෑම කාළ පරිඡ්චේදයකදීම සහ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. වලට සංක්‍රමණය වීමේදී 2014 අප්‍රියෙල් 01 දිනට ආරම්භක ශ්‍රී.ල.මූ.වා.ප්‍ර මූල්‍ය තත්ව ප්‍රකාශණය සඳහා පහත පැහැදිලි කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති නොකඩවා ව්‍යවහාර කරන ලදි. පුරෝකථනය කල හැකි අනාගත කාල සඳහා අඛණ්ඩ පැවැත්මක් ආයතනය සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකල්පනය කර ඇති අතර සමාගම ඈවර කිරීමේ හෝ ව්‍යාපාර කටයුතු අවසන් කිරීමේ අදහසක් ඔවුන් සතුව නැත.

**3.1.** විදේශ මුදල්

**3.1.1** විදේශ මුදල් ගණුදෙනු හා ශේෂයන්

විදේශ මුදලින් කෙරෙන ගණුදෙනු සමාගම විසින් ගණුදෙනුව සිදුවන දින ක්‍රියාකාරි තත්කාලීන විනිමය අනුපාතිකව වාර්ථා කරයි. විදේශ මුදලින් මිල අභිධානීකරණය මූල්‍ය වත්කම් හා වගකීම් වන විට වාර්තා කරන දිනට තත්කාලීනව බලපවත්වන අනුපාතිකය අනුව ව්‍යවහාර මුදලට නැවත පරිවර්තනය කෙරේ. පරිවර්තනය නිසා ඇති වන සියලුම ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ.

**3.2.**දේපළ පිරියත හා උපකරණ

එක කාළපරිච්ඡේදයකට වඩා වැඩි කාලසීමාවක් තුල භාවිතය කිරීම සඳහා වූ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා හෝ වෙනත් අයට බදු දීම හෝ පරිපාලන කටයුතු සඳහා යොදාගන්නා ස්පෘශ්‍ය අයිතමයන් දේපළ පිරියත උපකරණ වේ. දේපළ, පිරියත උපකරණ අයිතමයන් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හාණිකරණ ඉවත් කර පොත් අගයට අගය කරනු ලබන අතර ඉඩම් අගය කරනුයේ එහි සාධාරණ අගයටය.

**3.2.1** හඳුනා ගැනීමේ පදනම

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් ඇත්නම් සහ වත්කම් වල පිරිවැය විශ්වාසවන්තව මිණිය හැකිනම් දේපළ, පිරියත උපකරණ හඳුනා ගනි.

**3.2.2.** මුල්වරට හඳුනා ගැනීම සහ මිණිම

අදාල වත්කමේ පිරිවැය සහ වත්කම වර්තමාන ස්ථානයට හා භාවිතා කල හැකි තත්වයට පත් කිරීමට අදාල අනෙක් සියළුම පිරිවැයෙහි එකතුව දේපල පිරියත උපකරණ වල පිරිවැය ලෙස සළකනු ලබයි.

ස්ව නිර්මාන වත්කම් වල පිරිවැය ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ පිරිවැය, අදහස් කළ ආකාරයට භාවිතා කළ හැකි තත්වයට ගෙන ඒමට සෘජුවම සම්බන්ධ වන, කොටස් ගැලවීම, සහ අයිතමයන් ඉවත් කිරීම සහ ඒවා තිබූ වැඩ බිම පිළිසකර කිරීම වැනි වෙනත් ඕනෑම පිරිවැයක් ඇතුලත් වේ.

### 3.2.3. පිරිවැය ආකෘතිය

සමාගම ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ වලට පිරිවැය ආකෘතිය ව්‍යවහාර කෙරෙණ අතර මිලට ගැණුම් පිරිවැය හෝ අනුශාංගික වියදම් සමඟ ඉදිකිරීම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කර වාර්තා කරයි.

### 3.2.3.1. පිරිවැය ආකෘතිය තෝරා ගැනීම

සමාගම ප්‍රත්‍යාගණන දිනය වූ 2007.03.12 දිනට ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන කළ අගය තෝරා ගෙන ඇත. ඒ අනුව ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ වල සැලකෙන පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කර දක්වයි.

සමාගම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයට අගය කරන අතර සාධාරණ අගයෙහි වෙනස් වීම් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ හඳුනා ගනී. සමාගම, ඉඩම් සහ ගොඩනැගිලි වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා 2007.03.12 දිනදී රජයේ ප්‍රධාන තක්සේරුකරුව යොදාගන්නා ලදි.

### 3.2.4 ප්‍රත්‍යාගණන ආකෘතිය

සමාගම 2007.03.12 දිනට ප්‍රත්‍යාගණනය කල නිරවුල් ඉඩම්, ගොඩනැගිලි, දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කළ පසු ඒවායේ සාධාරණ වටිනාකමට පවත්වාගෙන යයි තවද සම්පූර්ණ පන්තියටම ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි.

සමාගමේ දේපළ, පිරියත හා උපකරණ 31.03.2012 ට පූර්ව ශ්‍රී.ල.ගි.ප්‍ර අනුව සැකසූ ප්‍රත්‍යාගණන වටිනාකමට මූල්‍ය තත්ව ප්‍රකාශණයෙහි ගෙනයනු ලැබේ.

### 3.2.5 පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හා උපකරණ පසුකාලීනව අගය කරන විට පිරිවැයට හෝ තක්සේරු වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණයන් අඩු කර එයට ප්‍රතිස්ථාපන පිරිවැයක් ඇත්නම් එයද එකතු කර අගය කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ වල විශේෂිත කොටස් කාලපරිච්ජේදයකට පසු ප්‍රතිස්ථාපනය කල යුතු වේ නම් එම කොටස් තනි වත්කමක් ලෙස සමාගම හඳුනාගනී. එම තනි වත්කම් සඳහා විශේෂිත ජීව කාලයන් නිර්ණය කරන අතර එයට අනුරූපව වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

### 3.2.6 පොත්වලින් ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය පොත් වලින් ඉවත් කරනුයේ එම අයිතමය බැහැරකිරීමකදී හෝ එම අයිතමය භාවිතයෙන් ආයතනයට අනාගත ආර්ථික වාසි අපේක්ෂා කල නොහැකි අවස්ථාවකදීය. මෙම ඉවත්කිරීමකදී ලාභයක් හෝ පාඩුවක් හට ගනී නම් එම ලාභය හෝ පාඩුව ආදායම් ප්‍රකාශණයට ඇතුලත් කරනු ලබයි. දේපල පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගයෙහි ප්‍රතිස්ථාපන පිරිවැයක් හඳුනාගනී නම් ප්‍රතිස්ථාපන කොටසෙහි ඉතිරි ධාරණ අගය පොත් වලින් ඉවත් කරනු ලැබේ.

### 3.2.7 ක්ෂය කිරීම

වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආපසුය. එනම් කළමනාකාරිත්වය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියා කළහැකි තත්වයේ හා ස්ථානයෙහි තිබෙන විටදීය. වත්කමක් විකුණා දැමීම සඳහා තබාගන්නා වත්කම් ලෙස වර්ග කළ දිනය (හෝ විකුණා දැමීම සඳහා වූ ඉවත් කිරීමේ කාණ්ඩයට ඇතුළත් සේ වර්ග කිරීම) සහ වත්කම් ඉවත් කල දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේදී වත්කමක් ක්ෂය කිරීම නවතා දමයි. වත්කමක් සම්පූර්ණයෙන් ක්ෂය කර නැත්නම් වත්කම අක්‍රියව පැවතියද ක්‍රියාකාරි භාවිතයෙන් විශ්‍රාම ගැන්වුවද ක්ෂය කිරීම නවත්වනු නොලැබේ.

ඉඩම් ක්ෂය නොකෙරේ. අනෙක් වත්කම් පහත දැක්වෙන සරල මාර්ග ක්‍රමය අනුව අදාළ ඇස්තමේතු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා විවිධ වර්ගයේ වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමාගම විසින් පරිභෝජනය කරන රටාව පරිදි ක්ෂය කෙරේ.

වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ථා කරණ කාලපරිච්ජේදයකට වරක් සමාලෝචනය කරයි. වර්තමාන සහ සංසන්දනාත්මක කාළ පරිච්ඡේද වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාල පහත පරිදිය.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| යන්ත්‍රාගාර හා උපකරණ | අවුරුදු 05 |
| මෝටර් රථ | අවුරුදු 05 |
| කාර්යාල උපකරණ | අවුරුදු 05 |

| | |
|---|---|
| කාර්යාලීය ගෘහභාණ්ඩ | අවුරුදු 10 |
| වැඩපොළ මෙවලම් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 05 |
| පරිගණක උපාංග | අවුරුදු 05 |

වත්කමෙහි ධාරණ අගය වත්කමෙහි අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි වූ විටෙක එම ධාරණ අගය අයකරගත හැකි වටිනාකම දක්වා වහාම ලියාහරිනු ලැබේ.

**3.2.8** මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

තොග හා විලම්භිත බදු හැර අනෙකුත් මූල්‍ය නොවන හා අස්පෘශ්‍ය වත්කම් වල ධාරණ අගයෙහි, හානිකරණය පිළිබඳ යම් කිසි ඇඟවීමක් ඇත්දැයි සෑම වාර්ථා කරණ දිනකදීම සමාලෝචනය කරනු ලබයි. එබදු ඉඟියක් පල කරයි නම් එම වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමෙහි හෝ එහි මුදල් ජනක ඒකකයක ධාරණ අගය ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකම අභිබවා යාම හානිකරණ පාඩුවක් ලෙසත් එහි විලෝමය හානිකරණ ලාභයක් ලෙසත් හඳුනා ගැනේ. වත්කමක හෝ මුදල් ජනක ඒකකයක අයකරගත හැකි වටිනාකම වනුයේ වත්කමෙහි භාවිත වටිනාකම හා එහි සාධාරණ අගයෙන් එය විකිණීම සඳහා වූ පිරිවැය අඩුකල විට ලැබෙන වටිනාකම යන අගයන් දෙකෙන් වැඩි අගය වේ. වත්කමෙහි භාවිත වටිනාකම ඇස්තමේන්තු කිරිමේදී, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවාගේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. මේ සඳහා යොදාගන්නා වට්ටම් අනුපාතිකය මුදලෙහි කාලඅගය හා වත්කම සඳහා වූ විශේෂිත අවදානම වර්තමාන වෙළඳපොළ අනුව තක්සේරු කිරීමෙන් ගණනය කොට ඇත. හානිකරණ පරීක්ෂාව සඳහා තනි වශයෙන් පරීක්ෂා කල නොහැකි වත්කම් කුඩා කණ්ඩායම් වශයෙන් (මුදල් ජනන ඒකක) එනම් අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව මුදල් ප්‍රවාහ ජනනය කල හැකි කුඩාතම වත්කම් එකතුවක් ලෙස පරීක්ෂාවට භාජනය කෙරේ.

**3.3** අස්පෘශ්‍ය වත්කම්

අදාළ උපකරණයේ සමස්ථ ක්‍රියාකාරිත්වයේ කොටසක් වන මිලට ගත් මෘදුකාංග පරිගණක උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරයි.

**3.4** ප්‍රාග්ධන නොනිමි වැඩ

වර්ෂය තුල වැය කරණ ලද වාර්තා කරන දිනට නිමි නොකරණ ලද ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන නොනිමි වැඩ ලෙස සලකන අතර වර්ෂය තුල නිම කරණ ලද සහ භාවිත කරන ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

**3.5** ජංගම වත්කම්

මුදල් හා බැංකු ශේෂ සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක් තුල හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලසීමාවක් තුල උපලබ්ධි කර ගත හැකි අයිතම ජංගම වත්කම් ලෙස හඳුනා ගනී.

**3.5.1**තොගය - සෘජු හා මිශ්‍ර පොහොර

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩු කර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලැබීම් පළමු නිකුතු ක්‍රමයටයි. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිලදී ගත් පොහොර පිරිවැයට දක්වා ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට බලාපොරොත්තු වන මිලෙන් එයට අදාල වියදම් අඩුකිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ.

**3.5.1.1** තොග හානිකරණය

තොගවල ශුද්ධ උපලබ්ධි අගය නිරූපණය වන පරිදි සියලුම සංචලනය නොවන සහ යල්පැන ගිය තොග සඳහා ඉඩ තැබීමක් කර ඇත.

**3.5.2** පාරිභෝගික ද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය

පාරිභෝගික ද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැයට දක්වා ඇත.

**3.6.** මූල්‍ය උපකරණ

**3.6.1** ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සමාගම මූල්‍ය වත්කම් හඳුනා ගනුයේ සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශවකරුවෙක් වන අවස්ථාවේදී පමණි. සමාගම එහි මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී වර්ගීකරණය කරයි. මූල්‍ය වත්කම් හඳුනා ගැනීමේදී සෘජුව ආරෝපිත කළ හැකි ගණුදෙනු පිරිවැය වල එකතුව සාධාරණ අගයට මණිනු ලැබේ. කෙසේ වුවත් සාධාරණ අගයට ලාභාලාභ තුලින් වර්ගීකරණය කරන මූල්‍ය වත්කම් සම්බන්ධව සෘජුව ආරෝපිත කළ හැකි ගණුදෙනු පිරිවැය නොසැලකේ.

පළමු හඳුනාගැනීමේදී, සමාගම විසින් මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩ වලට වර්ගීකරණය කරයි.

අ) කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

ආ) ණය සහ ලැබිය යුතු දෑ

**3.6.1.1** කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

ස්ථාවර හෝ නිශ්චය කලහැකි ගෙවීම් සහිත වත්කමෙහි වටිනාකමින් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආයෝජනය කල්පිරෙන තුරු තබාගැනීමේ ආකල්පයක් හා හැකියාවක් ඇත්නම් මෙම කාණ්ඩය තුල වර්ගීකරණය කරයි. මෙම ආයෝජන ජංගම වත්කම් තුල නිරූපණය කරයි.

**3.6.1.2** ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ ස්ථාවර හෝ තීරණය කළ ගෙවීම් සහිත සක්‍රිය වෙළඳ පොළක මිළ කියුම් නොලත් සහ සමාගම ක්ෂණිකව හෝ ඉදිරි කාළයේ විකිණීමට බලාපොරොත්තු නොවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මෙම අයිතමයන් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර කල්පිරෙන කාලය වාර්ථාකරණ දින සිට මාස 12ට වැඩි ආයෝජන ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. සහනාධාර ලැබීම්, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරුකුම් ප්‍රතිමිලදී ගැනීම්, ස්ථාවර තැන්පත්, අත්තිකාරම්, තැන්පත්, සේවක ණය සහ මුදල් සහ කාළ පරිච්ඡේදය අවසානයේ මුදලට සමාන වන දේ සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

**3.6.2** මුල් හඳුනාගැනීම හා මිණුම්කරණය

සමාගම මුල් හඳුනාගැනීමේදීම මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරයි.

**3.6.3** ලාභ අලාභ තුලින් සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්

වෙළඳ පරමාර්ථයෙන් ලග තබාගන්නා ආයෝජන ලෙස හඳුනාගන්නා අයිතම හා මුල් අවස්ථාවේ එලෙස වර්ගීකරණයට ලක්වන වත්කම් මෙලෙස හඳුන්වයි.

**3.6.4** පසුකාලීන මිණුම්කරණය

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිණුම්කරණය පහත දක්වා ඇති ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**3.6.4.1** ලාභ අලාභ තුලින් සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්

වෙළඳ පරමාර්ථයෙන් ලග තබාගන්නා ආයෝජන ලෙස හඳුනාගන්නා අයිතමයන් හා මුල් අවස්ථාවේ එසේ වර්ගීකරණයට ලක්වන වත්කම් මෙලෙස හඳුන්වනු ලබන අතර, වෙළඳ පරමාර්ථයෙන් ලග තබාගන්නා ආයෝජන යනු නුදුරු අනාගතයේ විකිණීම හෝ නැවත මිලදී ගැනීම මේ අදහසින් අත්පත් කරගන්නා වත්කම් වේ.

**3.6.4.1.1** කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල්පිරෙන තෙක් ලග තබාගන්නා ආයෝජන පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනයේදී වත්කම් අත්පත් කරගැනීමේදී හටගත් වට්ටම හෝ අධිහාරයද ගණුදෙණුව සඳහා වැයවූ ගණුදෙණු පිරිවැයද සලකා බලනු ලැබේ.

**3.6.4.1.2** ණය හා ලැබිය යුතු දෑ

සඵල පොලී අනුපාතිකය භාවිතකොට ක්‍රමක්ෂය කරන ලද පිරිවැයෙන් හානිකරණ වෙන්කිරීම් අඩුකලපසු ලැබෙන පිරිවැයට මෙම අයිතම පසු කාලීනව අගය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනයේදි වත්කම් අත්පත් කරගැනීමේදී හටගත් වට්ටම හෝ අධිහාරයද, සඵල පොලී අනුපාතිකය හා සම්බන්ධ අනෙක් පිරිවැයද සලකා බලනු ලැබේ. සඵල පොලී අනුපාතිකයේ ක්‍රමක්ෂය පිරිවැය ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය වියදම් කාණ්ඩය යටතේ ගිණුම් ගත කරනු ලබයි.

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වූ අයිතිය ඉකුත් වූ පසු හෝ එම අයිතිය වෙනත් පාර්ශවයකට මාරු කල පසු (වත්කමෙහි අයිතිය හා බැදුණු සියළුම අවදානම් සහ වරප්‍රසාද තවත් පාර්ශවයක් වෙත මාරු කල පසු) එම වත්කම් ගිණුම් ප්‍රකාශ වලින් බැහැර කරනු ලැබේ. හානිකරණය හේතුවෙන් හටගන්නා අලාභයන් ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

**3.6.5** හඳුනාගැනීම අත්හැරීම

මූල්‍ය වත්කම් හා බැදුණු ගිවිසුම්ක අයිතිය සමාගම වෙතින් ඉක්මවූ පසු හෝ වත්කම හා බැදුණු ප්‍රමාණාත්මක අවදානම් හා වරප්‍රසාද තවත් පාර්ශවයක් වෙත මාරුකල පසු, මෙම වත්කම් ගිණුම් වලින් බැහැර කරනු ලබයි.

මෙම අයිතිය අන්පාර්ශවයකට පැවරීමේ ක්‍රියාවලියේදී අදාල වත්කම හා බැදි පොළී ප්‍රමාණයක් ඒ සමග මාරු නොවුණේ නම් එම පොළී ප්‍රමාණය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ නිරූපණය කරයි. හඳුනාගැනීම අත්හැරීමකදී වත්කමෙහි ධාරණ අගය හා ඒ වෙනුවෙන් ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශයෙහි නිරූපණය කරයි.

**3.6.7** මූල්‍ය වත්කම් වල හානිකරණය

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙන යෑම

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන වත්කම් සඳහා සෑම වාර්ථාකරණ දිනක් අවසානයේදීම එම වත්කම් වල හානිකරණය පිළිබඳ සුළු හෝ සාක්ෂියක් ඇත්දැයි තනි වශයෙන් හෝ සාමූහිකව පරීක්ෂා කෙරෙන අතර. එබඳු සාක්ෂියක් ඇත්නම් හානිකරණය තක්සේරු කරනු ලැබේ.
වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ එක් සිදුවීමක් හෝ සිදුවීම් කිහිපයක් හේතුවෙන් එම වත්කමෙන් අපේක්ෂිත විශ්වාසිදායි ලෙස ඇස්තමේන්තු කල හැකි අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් වේ නම්, එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් හානිකරණය කරනු ලැබේ. සිදුවූ අලාභය වත්කමෙහි ධාරණ අගය හා අනාගතයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනසින් මණිනු ලැබේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම සතුවූ මුල් සඵල පොළී අනුපාතිකයටය.
ක්‍රමක්ෂය පිරිවැය මත පිරිවැය කරන ලද ණය හා ලැබිය යුතු දෑ සහ කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන සඳහා හානිකරණ පාඩුව ගණනය කරනුයේ වත්කමෙහි ධාරණ අගය හා එම වත්කම හේතුවෙන් අනාගතයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (දැනට හටනොගත් අනාගත ණය හානි හැර) අතර වෙනස මගිනි. මෙම අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරනුයේ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයෙනි. මූල්‍ය වත්කමෙහි ධාරණ අගය ක්‍රමයෙන් අඩුවෙයි නම් අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.
පසුකාලීන කාලපරිච්ඡේදයකදී, හානිකරණ අලාභයෙහි ප්‍රමාණය අඩුවේනම් සහ එම අඩුවීම හානිකරණය හඳුනාගැනීමෙන් අනතුරුව හටගත් සිදුවීමක් හා විෂයානුබද්ධ නම්, කලින් හඳුනාගත් හානිකරණ පාඩුව ප්‍රත්‍යාවර්ථ කරනු ලැබේ. (විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි)

**3.6.6.1** ණය සහ ලැබිය යුතු දෑ

සමාගම විසින් ලැබිය යුතු ශේෂ සඳහා තනිතනිව සහ එසේ නොහැකි විට සමූහිකව හානිකරණ පරීක්ෂණය සිදුකරනු ලබයි. තනිතනිව ගත්කල සැලකිය යුතු මට්ටමක නොවන ශේෂ සාමූහිකව පරීක්ෂණයට ලක්කරයි.

සාමූහිකව හානිකරණ ඇගයීමේදී ණය ගෙවීම් පැහැරහැරීමේ ඓතිහාසික ප්‍රවණතාවය, ණය අයකර ගැනීමට ගත වන කාලසීමාව හා සිදුවූ පාඩුවෙහි ප්‍රමාණය යන අංග සැලකිල්ලට ගනී. තවද වර්තමාන ආර්ථික තත්වයන් යටතේ සිදුවිය හැකි තත්‍ය අලාභය ඓතිහාසික දත්තයන් හා සැසඳීමේදී පූර්ව අලාභයන් ඉක්මවා යයිද ඊට වඩා අඩු අගයක් ගනීද යන්න කළමණාකරණයේ මතය මත තීරණය කරයි.

හානිකරණ අලාභයන් ලාභ අලාභ වල හඳුනාගන්නා අතර ඉඩහැරීමේ ගිණුමක සටහන් කරනු ලබයි. පසුකාලීනව සිදුවන සිදුවීමක් හේතුවෙන් හානිකරණ අලාභය අඩුවේ නම් එම අඩුවීම ලාභ අලාභ තුලින් ප්‍රතිවර්ත කරනු ලැබේ.

**3.7** වෙළඳ ලැබිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුලදී භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබිය යුතු දෑ වේ. ණය එකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුලදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනීමේදී වෙළඳ ලැබිය යුතු දෑ ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් පසුව වෙළඳ ලැබිය යුතු දෑ හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම්කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක්වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය එකතු කිරීම පිළිබඳ අතීත පලපුරුද්ද ගෙවීම් ප්‍රමාද වීමේ දින ගණන උපරිමය දින 90 ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේදී සලකා බලයි. වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියළුම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ.

තනි තනිව ඇගයීමේ ක්‍රමය: හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

i. විවිධ සේවා සමුපකාර සමිති
ii. ගොවිජන සේවා මධ්‍යස්ථාන
iii. බලයලත් නියෝජිතයන්
iv. රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු

**3.8** මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 ට අඩු කාලයකින් කල් පිරෙන ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

**3.9** ප්‍රකාශිත ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කෙරේ.

**3.10** මූල්‍ය වගකීම්

**3.10.1.** ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

**3.10.1,1** මූල් හඳුනා ගැනීම සහ මැණීම

මූල්‍ය වගකීම් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී.ල.මූ.ගි.ප්‍ර විෂය පථය තුල මූල්‍ය සාධණ පත්‍රෙය් ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශවකරුවෙක් වු විට පමණක් හඳුනා ගනී. මූල්‍ය වගකීම් මුල් වරට සාධාරණ අභයට හඳුනාගනී. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය වගකීම් ලාභාලාභ මගින් සාධාරණ අභයට සහ වෙනත් මූල්‍ය වගකීම් යන වර්ගීකරණය වර්ග දෙකකින් හඳුනා ගැනියි. සමාගම එහි මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් වර්ග ලෙස වර්ගීකරණය කර ඇත.

**3.10.2** වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය ගැනුම්, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරාව වෙනත් මූල්‍ය වගකීම්හි ඇතුලත්ය. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගණුදෙණු වටිනාකම වන සාධාරණ අගයට හඳුනා ගනී. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනී.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැදියාව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු වලින් පැණ නැගී වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

**3.10.3** ණය ගැනුම්

**3.10.3.1** මුල් හඳුනාගැනීම

ණය ගැනුම් මූලිකව වාර්තා කල ශුද්ධ ගණුදෙණු වටිනාකමට, සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය වු වටිනාකමට හඳුනාගනී.

**3.10.3.2.** පසු කාලීන හඳුනා ගැනීම සහ මැණීම

සමාගම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් වර්ගයට වර්ගීකරණය කරයි. එවැනි මූල්‍ය වගකීම් මුල් වරට ඍජුව ආරෝපිත කළ හැකි ගණුදෙණු පිරිවැය එකතු කළ සාධාරණ අභයට හඳුනා ගැනියි. මුල් වරට පසුව පසු කාලීනව පොළී දරණ ණය සහ ණයට ගැණීම් ඇතුළු මෙම මූල්‍ය වගකීම් සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට මණිනු ලැබේ. වත්කම හඳුනා ගැනීම අත් හැරීම වාසි සහ හානි ලාභාලාභ මගින් හඳුනා ගනී.

**3.10.4** ණය ගැණුම් පිරිවැය

ණය ගැණුම් පිරිවැය, ඒවා වාර්තා කල කාල පරිච්ජේදයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනී.

**3.11** රාජ්‍ය ප්‍රදාන හා සහනාධාර

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් සහ සමාගම විසින් අදාල කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගනී.
ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාර වලට අදාළ වියදම් එම වියදම දරනු ලබන්නාවූ කාලපරිච්ජේදයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබඳ සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හඳුනා ගැනේ.
දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන ලෙස විලම්භිත රාජ්‍ය ප්‍රදාන ජංගම නොවන වගකීම්වලට ඇතුලත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුල සරල මාර්ග ක්‍රමයට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගනී.

**3.12** වර්තමාන හා විලම්භිත බදු

සමාගම ආදායම් බදු වලට යටත්වේ. සමාගම ස්වතක්සේරු ක්‍රමය මත බදු වගකීම හඳුනාගත්තද අවසාන බදු ප්‍රතිඵලය මුලදී වාර්ථා කළ බදු වලට වඩා වෙනස් විය හැක. මෙවන්වූ වෙනස නිශ්චය කරනු ලබන කාළ පරිච්ජේදයේ වර්තමාන හා විලම්භිත ආදායම් වත්කම් සහ වගකීම් වලට බලපායි. කාලපරිච්ජේදය සඳහා අදාළ බදු වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගනු ලබන්නේ ඒවා ඍජුව ස්කන්ධයට හඳුනා ගැනෙන අයිතමයන් හෝ අනෙකුත් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

**3.12.1** වර්තමාන බදු

ගෙවිය යුතු යයි බලාපොරොත්තුවන බදු හෝ වර්ෂය සඳහා වූ බදු අනුපාතය මත හෝ සමාගමට අදාලවන වාර්ථා කරණ කාළ පරිච්ඡේදයට පසුව පනවන ලද නීති මත පදනම් කර ගණනය කළ ලැබිය යුතු බදු ආදායම් හෝ පාඩු සහ පෙර වර්ෂ වලට ගෙවිය යුතු බදු සඳහා කෙරෙන ගැලපිළි වර්තමාන ආදායම් බදු අය කිරීම් වේ. ස්කන්ධයට සෘජුව අදාළ වන වර්තමාන බදු ලාභාලාභ මගින් නොව ස්කන්ධයෙහි හඳුනාගනී. කළමනාකාරිත්වය බදු අධිකාරින්ට ගෙවිය යුතු යයි බලාපොරොත්තුවන ප්‍රමාණ උචිත වන පදනම මත වරින් වර සමාලෝචනය කරයි.

**3.12.2** විලම්භිත බදු

වත්කම් හා වගකීම් වල ගණකාධිකරණ ක්‍රියාවලිය සඳහා වූ ධාරණ අගය හා බදු ගණනය සඳහා වූ ධාරණ අගය අතර ඇති වන තාවකාලික වෙනස විලම්භිත බදු ලෙස හඳුනා ගනී.

බදු ගෙවිය යුතු ලාභයක් හෝ අලාභයක් සඳහා බලපෑම් නොකරන ව්‍යාපාර සංයෝජන අවස්ථාවක් හැර අනෙක් අවස්ථාවක වත්කම් හා වගකීම් මුල් අවස්ථා හඳුනාගැනීමේදී විලම්භිත බදු ගණනය නොකරයි. වාර්ථාකරණ දිනය වන විට බලාත්මක කර ඇති බදු අනුප්‍රමාණයට අනුව හා අදාල විලම්භිත බදු වත්කම උපලබ්ධි වන කාලයකදී හෝ විලම්භිත බදු වගකීම පියවීමක් සිදුකරන කාලයකදී යෙදවීමට බලාපොරොත්තුවන බදු අනුප්‍රමාණයට අනුව බදු ගණනය කරනු ලබයි.

අනාගත බදු අයකල හැකි ලාභ ඇතිවේ නම් ඊට එරෙහිව අදාල ධාරණ අගයන්හි ඇතිවූ තාවකාලික වෙනස භාවිත කල හැකි නම් පමණක් විලම්භිත බදු හඳුනාගනී.

විලම්භිත බදු වත්කම් වලට එරෙහිව විලම්භිත බදු වගකීම් හිලව් කරනුයේ, එසේ කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇත්නම් සහ බදු වත්කම් සහ වගකීම් බදුගණනය කරනුයේ එකම බදු අධිකාරියක් මගින් නම් පමණි.

විලම්භිත වත්කම් වල ධාරණ අගය සෑම වාර්ථාකරණ දිනක් අවසානයේදීම සමාලෝචනය කරන අතර, විලම්භිත බදු වත්කම සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් භාවිත කිරීමට තරම් අනාගත බදු අය කල හැකි ලාභ තවදුරටත් හට නොගන්නා බව භව්‍ය වේ නම් වත්කමෙහි ධාරණ අගය අදාල වටිනාකමට අඩුකරනු ලැබේ. හඳුනා නොගන්නා ලද විලම්භිත බදු වත්කම් නැවතත් වාර්ථාකරණ කාලච්ඡේදයේ අවසන් දිනයේදී තක්සේරු කරන අතර එම බදු වත්කම ප්‍රතිපූරණය කිරීමට තරම් අනාගත බදුකල හැකි ලාභ ඇති බවට භව්‍ය වේ නම් එම අදාල සීමාව තෙක් වත්කම හඳුනාගනී.

භාවිත නොකල බදු අලාභයන්, බදු බැර සහ වත්කම් වල ධාරණ අගය හා සම්බන්ධිත අඩුකල හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු අගය හඳුනාගනු ලබන්නේ එම වත්කම් ප්‍රතිපූරණයට තරම් අනාගත බදුකලහැකි ලාභ ඇතිවේ යැයි භව්‍ය වන තරමටය.

**3.13** සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

සමාගම 'විශ්‍රාම ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලැස්ම' හා 'නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම' භාවිත කරයි.

**3.14** විශ්‍රාම ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලැස්ම

ආයතනය විසින් වෙනම අරමුදලකට නිශ්චිත දායකත්වයක් ලබාදීම මගින් මෙම විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය පවත්නාගෙන යනු ලැබේ. මෙම නිශ්චිත අගය හැර වෙනයම් හෝ දායකත්වයක් සඳහා ආයතනය සතුව නෛතික හෝ ස්වනිර්මාණිත වගකීමක් නොමැත. මෙම දායකත්වය සේවකයා විසින් සේවය සපයන කාලසීමාව තුල සේවක වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

**3.14.1** සේවක අර්ථසාධක අරමුදල

සමාගම සහ සේවකයින් සෑම සේවකයකුගේ වැටුපෙන් 12% සහ 10% ලෙස පිලිවෙලින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරන සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

**3.14.2.** සේවක භාරකාර අරමුදල

සමාගම සෑම සේවකයකුගේ වැටුපෙන් 3% ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරන සේවක අර්ථසාධක අරමුදලට දායක වේ. නිර්වචිත දායක සැලසුමට දායක වීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වියදම දැරූවිට හඳුනා ගනී.

**3.14.3** නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් හැර පශ්චාත් ප්‍රතිලාභ සැලසුමකි. සමාගම 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට බැඳී සිටී වගකීම වාර්ථා කරණ දිනයට නිර්වචිත ප්‍රතිලාභ සැලසුමේ වර්තමාන අගය ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනී.

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සුදුසුකම් ලත් ආයු ගණක වරයකු මගින් ශ්‍රී.ල. ගි.ප්‍ර අංක 19 සේවක ප්‍රතිලාභයන්හි සුදුසු යයි දක්වන කරන ලද ඒකක බැර ක්‍රමය අනුව ගණනය කරයි. එවැනි ආයු ගණක අභැයීම් සෑම වසරකට වරක් කල යුතුය. ආයු ගණක අභැයීමේදී නිර්වචිත දායක සැලසුමට දායක වීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වියදම දැරුවිට හඳුනා ගනී.

ගැලපිලි හෝ ආයු ගණන උපකල්පන වෙනස් වීම නිසා පැනනගින සත්‍ය ආයු ගණක ප්‍රතිලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වියදම දැරුවිට හඳුනා ගනී. අදාළ සේවක පිරිවැය සහ වෙනත් පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදමක් හඳුනා ගනී. සමාගම සේවක විශ්‍රාම ප්‍රතිලාභ නිසා පැන නගින වගකීම් සඳහා බාහිරින් මුදල් සැපයීමක් නො මැත.

**3.14 4.** කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

**3.15** වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

අතීතයේ සිදුවූ සිදුවීමක් හේතුවෙන් වර්තමානයේ නෛතික හෝ ස්වයං නිර්චිත වගකීමකට බැදීමට සමාගමට සිදුවේ නම් හා එම වගකීම පියවීම සඳහා සමාගමේ ආර්ථික සම්පත් වැය කිරීමට සිදුවීමේ සම්භාවිතාවයක් ඇත්නම් සමාගම මෙහෙයුම් වියදම් සඳහා වූ වෙන්කිරීම් හඳුනා ගනී.

වෙන්කිරීම් මණිනුයේ වර්තමාන බැදියාව පියවීමට අවශ්‍ය ඇස්තමේන්තු වියදමට අනුවය. මෙම වියදම ඇස්තමේන්තුගත කරණුයේ වාර්තාකරණ දිනට ඇති විශ්වාසදායි සාක්ෂි පදනම් කරගෙනය. මෙහිදී වර්තමාන බැදියාව (වගකීම) හා ආශ්‍රිත අවදානම සහ අනපේක්ෂිත තත්වද සලකා බලනු ලබයි.

**3.16** ප්‍රාග්ධන බැදීම් සහ අසම්භාව්‍යයන්

අනාගතයේ සිදුවිය හැකි අවිනිශ්චිත සිදුවීමක් හෝ වර්තමාන බැදීමක් සිදුවීම හේතුවෙන් ආයතනයේ ආර්ථික සම්පත් ආයතනයෙන් පිටතට ගලා යාමේ සම්භාවිතාවක් ඇත්නම් අසම්භාව්‍ය වගකීම් හඳුනා ගැනේ. ප්‍රාග්ධන බැදීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශ වල අදාළ සටහන් වල හෙළි දරව් කෙරේ.

**3.17** වාර්තාකරණ කාලපරිච්චේදයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ජේදයට පසු සිදුවීම් වල ප්‍රමාණවත් භාවය සලකා බලා අවශ්‍ය පරිදි සුදුසු ගැලපිලී සහ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ වල සිදු කෙරේ.

සම්පත් පිටතට ගලා යෑමේ ප්‍රවනතාව දුරස්තර නම් හැර සියලුම අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශ වල අදාළ සටහන් වල හෙළිදරව් කෙරේ.

**4.** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ට අනුව ඍජු ක්‍රමයට සකස් කරනු ලැබේ. පූර්ව දැනුවත් වටිනාකමකට හුවමාරු කිරීමට සුදානමින් පවතින හා එම වටිනාකමෙහි වෙනසක් සිදුවීමේ අවධානම ඉතා අඩු අගයක පවතින, ඉහල ද්‍රවශීලතාවයක් සහිත කෙටි කාලීන ආයෝජන වලින් මුදල් සහ මුදල් වලට සමාන දෑ සමන්විත වේ. මුදල් සහ මුදල් වලට සමාන දෑ වලට අතැති ද මුදල්, බැංකු ශේෂ, බැංකු තැන්පතු, ඒක්ෂණ මුදල් ඇතුලත් වේ.

**5.** ආදායම් හඳුනාගැනීම

භාණ්ඩ විකිණීම හේතු කොටගෙන ලද හා ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙහි ශුද්ධ (ජාතිය ගොඩනැගීමේ බදු අඩු කොට) සහනාධාර වටිනාකමෙන් ආදායම් මණිනු ලැබේ. සමාගම විසින් ආදායම් හඳුනාගනු ලබන්නේ අදාල ආදායමෙහි වටිනාකම විශ්වාසදායි ලෙස මිණිය හැකි වන විට සහ අනාගත ආර්ථික වාසි ආයතනය වෙත ගලා ඒමේ ඉහල සම්භාවිතාවක් ඇති විටය.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

**5.1** පොහොර විකිණීම

සමාගම ඍජු පොහොර ආනයන කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම සිදු කරයි. භාණ්ඩ සම්බන්ධ සියළුම අවධානම් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයාට මාරුවන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් නිකුත් කරනු ලබන අවස්ථාවේදීම ආදායම හඳුනා ගනී.

**5.2** පොළී ආදායම

සඵල පොළී අනුපාතිකය භාවිත කර පොළී ආදායම හඳුනාගනී.

**5.3** කුලී ආදායම

කුලී ආදායම හඳුනාගනු ලබන්නේ බදු කාලය තුල උපචිත පදනම මතය.

**5.4** දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගයන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සංසන්දනය කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනාගනී.

**5.5** වෙනත් ආදායම්

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මතය.

**6.** වියදම්

ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සඳහා සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා කරන ලබන සියලුම වියදම් වර්ෂයේ ලාභ ගණනය කිරීමේ දි ආදායමට අය කෙරේ. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණ ක්‍රමය සමාගමේ මූලික කාර්ය සාධකය සාධාරණ ලෙස ඉදිරිපත් කරණ බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වන නිසා එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමය තෝරා ගෙන ඇත. ස්ථාවර ස්වරූපයෙන් පවතින එමගින් ව්‍යාපාර කරගෙන යන වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදු කෙරෙන හෝ ව්‍යාපාරයේ ඉපැයීමේ ධාරිතාව වැඩිකිරීම කෙරෙන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.
අළුත්වැඩියා සහ අළුත්කිරීම් වියදම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයයේ ආදායමට අය කරනු ලැබේ. සමාගම ඉපැයූ ලාභ යනු ආදායම් බදු වියදමට පෙර සහ සියලුම දන්නා වගකීම් සහ හානිකරණ සහ දේපල, පිරියත සහ උපකරණ වල ක්ෂය සඳහා ප්‍රතිපාදනය කළ පසුවේ.

**7.** බැදීම්

වාර්තාකරණ දිනය මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත යුතු හා ගැලපිය යුතු සියලුම බැදීම් මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් තුල දක්වා ඇත.

**8.** ලාභාංශ මත රඳවා ගැනීමේ බදු

බදු ගෙවිය යුතු ලාභයෙන් බෙදා හැරෙන ලාභාංශ 10% බදු වලට යටත්වේ.

**9.** වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පනයන්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම හා මිණුම්කරණය පිළිබඳව කළමණාකාරිත්වය තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන ගණනාවකට එළඹ ඇත.

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේදී විශේෂ විනිශ්වයන් කරනු ලබන අතර ඒවා මූල්‍ය වාර්තා වලට විශේෂිත බලපෑමක් ඇති කරයි.

**9.1** විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම
විලම්භිත බදු වත්කම් භාවිතා කල හැකි අනාගත බදු අය වන ආදායමේ තක්සේරුව මත විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය වේ.

වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීමේදී සහ මැණීමේදී විශේෂිත බලපෑමක් කරන ඇස්තමේන්තු හා නිගමනයන් පහත පරිදි වේ.

**9.2** ක්ෂය කල හැකි වත්කම්හි ඵලදායි ජීව කාලය
අපේක්ෂිත භාවිත මත කළමණාකාරිත්වය විසින් සෑම වාර්තාකරණ දිනයකටම ක්ෂය කලහැකි වත්කම්හි ඵලදායි ජීවකාලය පිළිබඳව ඇස්තමේන්තු නැවත විමසා බලයි. තාක්ෂණික යල්පැනීම හේතුකොටගෙන ඇස්තමේන්තු වල සිදුවන අවිනිශ්විතතාවයන් නිසා මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ වල ඵලදායි ජීවකාලය පිළිබඳ වෙනස් වීම් සිදුවිය හැක.

**10.** නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

ආයු ගණක පදනම මත භාවිතා කල සාධක රාශියකගේ නිගමනයන් මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල වර්තමාන අගය රඳා පවතී. මෙම උපකල්පනයන්, වට්ටම් අනුපාතය භාවිතා කරමින් ශුද්ධ පිරිවැය හා බැදීම තීරණය කරයි. නිගමනයන්ගේ වෙනස්වීම් මත ඇතිවන බලපෑම නිශ්චිත ප්‍රතිලාභ බැදීමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ.

**11.** ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල් වරට භාවිතය

2013 මාර්තු 31 දිනෙන් අවසන් වාර්තා කරන කාල සීමාව සඳහා පිළියෙල කරන ලද මෙම මූල්‍ය වාර්තා සමාගම ශ්‍රී.ල.මු.වා.ප්‍ර. ට අනුකූලව පිළියෙල කර පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලය වේ. 2012 මාර්තු 31 දිනෙන් අවසන් වාර්තා කාල සීමාවද ඇතුළුව සමාගම විසින් තම පෙර මූල්‍ය වාර්තා 2012 මාර්තු 31 දක්වා බලපැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ආරම්භක මූල්‍ය වාර්තා කට්ටලය ලෙස 2011 අප්‍රේල් 01 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ශ්‍රී.ල.මූ.වා.ප්‍රමිතිවලට අනුව පිළියෙල කර ඇත. මෙම සටහන් තුලින් ගිණුම්කරණ ප්‍රමිතිවල සිට ශ්‍රී.ල.මූ.වා.ප්‍රමිති දක්වා වාර්තා කිරීමට 2011 අප්‍රේල් 01 වෙනි දිනට සහ 2012 මාර්තු 31 දිනට මූල්‍ය වාර්තා වල සිදුකල වැදගත් ගැලපීම් දක්වා ඇත.

**11.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුව අතීතයානුයෝගි විකල්ප ව්‍යාතිරේඛයන්**

අතීතයට බලපාන ලෙස ශ්‍රී.ල.මූ.වා.ප්‍ර අදාල කර ගැනීමේදී විකල්ප ව්‍යාතිරේඛයන් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මුල්වරට අනුකූල වීමේදී සමාගම තෝරා ගත් අනෙකුත් විකල්ප මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පහත පරිදි වේ.

**11.1.1 ප්‍රත්‍යාගණනය ගිලුණු පිරිවැයක් ලෙස**

ඉඩම් හා ගොඩනැගිලි හැර දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අගය 2012 මාර්තු 31 පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇත. ප්‍රත්‍යාගණනයේදී ඒවා සාධාරණ අගය සමග සැසඳීම සඳහා අපහසු බැවින් සමාගම එම දිනයට ප්‍රත්‍යාගණනය ගිලුණු පිරිවැයක් ලෙස ගෙන ඇත.

**11.1.2 පහත දැක්වෙන විකල්ප ව්‍යාතිරේකයන් සමාගමට අදාල නොවේ.**

i ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.4 - රක්ෂණ ගිවිසුම් සමාගමට අදාල නොවන නිසා

ii ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 - පෙර හඳුනාගත් මූල්‍ය උපකරණ නිම්තිකරණය. සමාගම සතුව සාධාරණ අගය ආදායම් ප්‍රකාශනය හරහා හඳුනාගන්නා විකිණීමට තබා ගන්නා මූල්‍ය වත්කම් හා වගකීම් නොමැත.

iii ජා.මූ.වා.ප්‍ර. 4 - කල්බදු අන්තර්ගතයන් පිළියෙල කිරීම - සමාගම සතුව එවැනි පිළියෙල කිරීමේ ගිවිසුම් නොමැත.

iv ශ්‍රී.ල.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ - සමාගම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ආයු ගණන වාසි සහ අවාසි හඳුනා ගනී.

v ශ්‍රී.ල.ගි.ප්‍ර. 21 - සමුච්චිත පරිවර්තන වෙනස්කම් - සමාගම සතුව විදේශ මෙහෙයුම් නොමැත.

vi ශ්‍රී.ල.ගි.ප්‍ර. 27 - පරිපාලිත, ආශ්‍රිතයන් හා බද්ධ ව්‍යාපාර - සමාගම සතුව එවැනි සමූහ ව්‍යාපාර නොමැත.

vii පරිපාලිත, ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාර වල වත්කම් හා වගකීම් - සමාගම සතුව එවැනි සමූහ ව්‍යාපාර නොමැත.

viii ශ්‍රී.ල.ගි.ප්‍ර. 32 - සංයුක්ත මූල්‍ය උපකරණ - සමාගම සතුව සංයුක්ත මූල්‍ය උපකරණ නොමැත.

ix වත්කම් හා වගකීම් වල ඇතුලත් පිරිවැය ඉවත් කිරීම - සමාගම සතුව වගකීම සමග පිරිවැය ඉවත් කිරීමේ හෝ පිරිවැය ප්‍රතිශ්ඨාපනය කිරීමේ ක්‍රමවේදයක් නොමැත.

x ජා.මූ.වා.ප්‍ර. 12 - සේවා සහන පිළියෙල කිරීම් - සමාගම සතුව එවැනි පිළියෙල කිරීම් නොමැත.

**11.1.3 අතීතයානුයෝගි භාවිතයේ අනිවාර්ය ව්‍යාතිරේකයන්**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුව පළමු මූල්‍ය වාර්තා පිළියෙල කිරිමේදි සමාගම පහත දැක්වෙන අතීතයානුයෝගි භාවිතයන් අදාල කර ගනී.

පහත දැක්වෙන අනිවාර්ය ව්‍යාතිරේකයන් සමාගමට අදාල නොවේ.

I. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගැනීම අතහැරීම
II. අවධානම් ගිණුම්කරණය

**11.1.4 ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. පරිවර්තනය වීමේ පැහැදිලි කිරීම්**

අංක 2.1 සිට 11.1.3 දක්වා වූ සටහන්, 2013 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහාත්, 2012 මාර්තු 31 දින සඳහාවූ සංසන්දනාත්මක තොරතුරු සඳහාත් 2011 අප්‍රේල් 01 වන දින එනම් සමාගම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සඳහා සංක්‍රමණය වූ දින සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහාත් යොදවා ඇත.

පසුගිය කාලච්ඡේද සඳහා වූ ගිණුම් ප්‍රකාශණ පිළියෙල කරන විට අවශ්‍ය ගැලපීම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූලව සිදුකරණ ලදි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලින් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට සංක්‍රමණය වීමේදී ඇති වූ වෙනස්කම් කොටස් හිමියන්ගේ ස්කන්ධ සැසදුම් ප්‍රකාශයේත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේත් සැසඳුම් ප්‍රකාශයට අදාල සටහන් වලත් නිරූපණය කර ඇත.

**12 තවම බලාත්මක නොවූ නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිතී**

**සමාගමේ මූල්‍ය ප්‍රකාශයේ නිකුත් කළ දිනවන විට නිකුත් කර ඇති තවම බලනොපත්වන ප්‍රමිතී පහත දැක්වේ. සමාගම එම ගිණුම්කරණ ප්‍රමිතී බලාත්මකවූ පසු භාවිතයට යොදා ගනී.**

**ශ්‍රී.ල.වා.ප්‍ර අංක 9 - මූල්‍ය සාධන පත්‍ර**

**ශ්‍රී.ල.වා.ප්‍ර අංක 13 - සාධාරණ අඟයට මැණීම**

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| **13** | ආදායම | | | |
| | දළ ආදායම | | 866,809,058 | 982,118,071 |
| | | | **866,809,058** | **982,118,071** |
| **14 අ** | සහනාධාරය මත විකුණුම් පිරිවැය | | **8,385,934,065** | **9,022,943,917** |

**මෙයින් නිරූපණය වන්නේ මහින්ද චින්තන පොහොර සහනාධාර වැඩසටහන යටතේ සෘජු වියදම් සඳහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කරනු ලබන මුදලය.**

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| **14 ආ** | විකුණුම් පිරිවැය | | | |
| | ගැනුම් | (සටහන14,b.1) | 8,889,258,462 | 9,551,120,537 |
| | සෘජු වියදම් | (සටහන14,b.2) | 142,312,403 | 214,869,834 |
| | නිෂ්පාදන පිරිවැය | | 9,031,570,865 | 9,765,990,371 |
| | අප්‍රේල් 01 දිනට නිමි තොගය | | 144,605,717 | 180,490,161 |
| | තොගය අතිරික්තය/ඌනතාවය | (සටහන14.b.3) | 110,042 | - |
| | මාර්තු 31 දිනට නිමි තොගය | | (173,460,034) | (144,605,717) |
| | | | 9,002,826,589 | 9,801,874,816 |
| | සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය | | 41,591,646 | 33,871,096 |
| | | | **9,044,418,235** | **9,835,745,912** |
| | **14.ආ.1** ගැනුම් | | | |
| | ආනයනික පොහොර වටිනාකම | | 8,977,230,681 | 8,704,220,755 |
| | කොන්ත්‍රාත්තු කම්කරු සේවා කුළිය | | 33,707,325 | 38,659,789 |
| | ජාතික ගොඩනැගීමේ බදු | | 8,690,949 | 9,819,743 |
| | සමාජ ආරක්ෂණ බදු | | - | 1,803,452 |
| | ප්‍රවාහන ගාස්තු | | 115,585,414 | 86,670,403 |
| | ඇසුරුම් ද්‍රව්‍ය | | 4,650,168 | 243,783 |
| | විනිමය අලාභ | | - | 709,702,613 |
| | විනිමය ලාභ | | (250,606,076) | - |
| | | | **8,889,258,462** | **9,551,120,537** |
| | **14.ආ.2** සෘජු වියදම් | | | |
| | කම්කරු සේවක කුලිය | සටහන **14.2.1.ආ** | 4,893,398 | 5,245,366 |
| | ප්‍රාදේශීය ගබඩා පිරිවැය | | 60,042,898 | 87,820,884 |
| | දිස්ත්‍රික් පොහොර ගබඩා ප්‍රවාහන වියදම | | 77,376,107 | 121,803,583 |
| | | | **142,312,403** | **214,869,834** |
| | **14.ආ.2.1** කම්කරු සේවක වියදම් | | | |
| | වැටුප් | | 2,663,220 | 2,813,395 |
| | සේවක අර්ථසාධක අරමුදල | | 321,995 | 337,607 |
| | සේවක භාරකාර අරමුදල | | 80,499 | 84,402 |
| | අතිකාල සහ 1/20 දීමනාව | | 554,960 | 874,378 |
| | ලබානොගත් කෙටි නිවාඩු සඳහා ගෙවීම් | | 14,271 | 13,358 |
| | ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | | 196,303 | 230,131 |
| | සුභසාධක හා වෛද්‍යාධාර | | 524,114 | 65,907 |
| | සංයුක්ත දීමනාව | | 12,485 | 53,111 |
| | නිල ඇඳුම් දීමනාව | | - | 13,272 |
| | දිරිගැන්වීම් ගෙවීම | | 525,552 | 759,805 |
| | | | **4,893,398** | **5,245,366** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

| | 2013 | 2012 |
|---|---|---|
| **14.ආ.3** තොග ඌනතා/අතිරික්ත | සහනාධාර අගයට | පිරිවැයට |
| තොග ඌනතා | (2,847,003) | (43,013,200) |
| තොග අතිරික්ත | 2,957,045 | 50,181,180 |
| | **110,042** | **7,167,980** |

සටහන : දීර්ඝ කාලයකට පසු 100% භෞතික සත්‍යාපනයකින් තොග ඌනතා හා අතිරික්ත පිරිවැය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමයට අගයකර ඇත.

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **14.ඇ** | සහනාධාරය මත පොදුකාර්ය පිරිවැය | **190,388,603** | **206,843,175** |

මෙයින් නිරූපණය වනුයේ පොදු කාර්ය පිරිවැය සඳහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කරනු ලබන මුදලය. 2012/13 – 126,926 මෙ.ටොන් @ රු. 1,500 - රු. 190,388,603
2011/12 – 137,895 මෙ.ටොන් @ රු. 1,500 - රු. 206,843,175

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **15** | වෙනත් ආදායම් | | |
| | කුලී ආදායම | 1,177,400 | 988,194 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 335,050 | 493,800 |
| | විවිධ ආදායම් | 1,056,216 | 4,502,115 |
| | අබලි ද්‍රව්‍ය විකුණුම් | 622,803 | 617,565 |
| | කඩිනම් නිෂ්කාශණ කිරීමේ ආදායම | 18,042,676 | 21,942,014 |
| | ස්ථාවර වත්කම් විකිණීම | - | 2,562,000 |
| | | **21,234,145** | **31,105,688** |
| **16** | ශුද්ධ මුල්‍ය ආදායම | **(1,758,422)** | **20,062,511** |
| **16.a** | මුල්‍ය ආදායම | | |
| | ස්ථාවර තැන්පතු සඳහා පොළිය | 41,780,685 | 33,936,101 |
| | ප්‍රතිමිලදී ගැණුම් සඳහා පොළිය | 13,994,533 | 25,512,448 |
| | නාමික බද්ද | 1,554,948 | - |
| | රැඳවුම් බද්ද | 4,642,298 | - |
| | සේවක ණය පොළිය | 538,762 | 371,952 |
| | | **62,511,226** | **59,820,500** |
| **16.b** | මුල්‍ය වියදම් | | |
| | බැංකු ගාස්තු | 12,334,200 | 1,385,059 |
| | දඩ මුදල් | 65 | - |
| | බැංකු අයිරා පොළිය | 2,224,617 | 351,984 |
| | කෙටි කාලීන ණය පොළිය | 24,290,320 | 20,479,028 |
| | දිගු කාලීන ණය පොළිය | 1,650,141 | (1,237,639) |
| | නොගෙවූ බිල් සඳහා පොළිය | 23,770,305 | 18,779,556 |
| | | **64,269,648** | **39,757,989** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| **17** | බදු පෙර ලාභය | | **181,928,588** | **314,143,499** |
| | බදු පෙර ලාභයෙහි පහත සඳහන් වියදම් ඇතුලත්ව ඇත. | | | |
| | දේපළ පිරියත හා උපකරණයන්හි ක්ෂය | (සටහන 20 ) | 15,358,640 | 11,981,743 |
| | විගණකගේ පාරිශ්‍රමිකය | (සටහන 17.1) | 300,000 | 548,747 |
| | අධ්‍යක්ෂක පාරිශ්‍රමිකය | (සටහන 17.2) | 1,661,849 | 1,505,150 |
| | වැටුප් හා වේතන | (සටහන 17.3) | 47,938,979 | 45,909,262 |
| | ණය ගැති හානිකරණය | | 511,220 | 1,679,187 |
| **17.1** | විගණන සේවා | | | |
| | විගණක ගාස්තු | | 300,000 | 532,696 |
| | විගණන ආශ්‍රීත සේවා | | - | 16,051 |
| | | | **300,000** | **548,747** |
| **17.2** | අධ්‍යක්ෂක පාරිශ්‍රමිකය | | | |
| | අධ්‍යක්ෂක දීමනා | | 1,462,849 | 1,505,150 |
| | අධ්‍යක්ෂක ගමන් වියදම් දීමනාව | | 200,100 | |
| | | | **1,661,849** | **1,505,150** |
| **17.3** | වැටුප් හා වේතන | | | |
| | විධායක ශ්‍රේණී පාරිශ්‍රමිකය | සටහන 17.3.1 | 11,398,188 | 11,895,555 |
| | ලිපිකරු ශ්‍රේණී පාරිශ්‍රමිකය | සටහන 17.3.2 | 35,880,667 | 32,641,685 |
| | ප්‍රධාන කාර්යාලීය අනියම්/පුහුණු පාරිශ්‍රමිකය | සටහන 17.3.3 | 660,124 | 1,372,022 |
| | | | **47,938,979** | **45,909,262** |

**2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන**

| සටහන | **17.3.1** | **17.3.2** | **17.3.3** | |
|---|---|---|---|---|
| | විධායක ශ්‍රේණිය | ලිපිකරු හා සමාන්තර සේවා | අනියම්/පුහුණු | එකතුව |
| වැටුප් | 7,135,209 | 20,260,255 | 469,950 | 27,865,415 |
| සේවක අර්ථසාධක අරමුදල | 856,225 | 2,431,086 | 56,394 | 3,343,706 |
| සේවක භාරකාර අරමුදල | 214,056 | 607,772 | 14,099 | 835,926 |
| ලබානොගත් කෙටි නිවාඩු සඳහා ගෙවීම් | | 152,135 | - | 152,135 |
| අතිකාල සහ 1/20 දීමනාව | 347,183 | 5,466,994 | 119,681 | 5,933,858 |
| ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 692,210 | 1,364,457 | - | 2,056,667 |
| සුභසාධක හා වෛද්‍යාධාර | 39,032 | 178,454 | - | 217,485 |
| සංයුක්ත දීමනාව | 3,595 | 662,845 | - | 666,440 |
| දිරිගැන්වීම් ගෙවීම | 2,110,678 | 4,756,669 | - | 6,867,347 |
| එකතුව | **11,398,188** | **35,880,667** | **660,124** | **47,938,979** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

**2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන**

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් | 6,813,805 | 17,483,846 | 1,247,618 | 25,545,269 |
| සේවක අර්ථසාධක අරමුදල | 817,657 | 2,098,062 | 36,741 | 2,952,459 |
| සේවක භාරකාර අරමුදල | 204,414 | 524,515 | 9,087 | 738,016 |
| ලබානොගත් කෙටි නිවාඩු සඳහා ගෙවීම් | - | 144,791 | - | 144,791 |
| අතිකාල සහ 1/20 දීමනාව | 1,107,208 | 6,107,569 | 78,577 | 7,293,353 |
| ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 563,896 | 1,170,631 | - | 1,734,526 |
| සුභසාධක හා වෛද්‍යාධාර | 135,548 | 618,618 | - | 754,166 |
| සංයුක්ත දීමනාව | 2,253,028 | 546,178 | - | 2,799,206 |
| දිරිගැන්වීම් ගෙවීම | - | 3,894,387 | - | 3,894,387 |
| නිල ඇඳුම් දීමනාව | - | 53,088 | - | 53,088 |
| එකතුව | **11,895,555** | **32,641,685** | **1,372,022** | **45,909,262** |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **18** | ආදායම් බදු වියදම් | | |
| | වර්තමාන බදු වියදම | 49,980,826 | 92,886,826 |
| | විලම්භිත බදු | 8,765,039 | 4,844,240 |
| | | **58,745,864** | **97,731,067** |
| **18.1** | ගිණුම්කරණ ලාභය හා වර්තමාන බදු වියදම සැසඳීම | | |
| | බදු පෙර ගිණුම්කරණ ලාභය | 181,928,588 | 314,143,499 |
| | ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිලදී ගැණුම් සඳහා පොළිය | (55,775,218) | (59,820,500) |
| | ඉඩදෙනු නොලබන අයිතමයන්ගේ එකතුව | 20,519,517 | 19,996,120 |
| | ඉඩදෙනු ලබන අයිතමයන්ගේ එකතුව | (30,142,403) | (5,235,671) |
| | අනෙකුත් මූලාශ්‍රවලින් ලද ආදායම | 61,972,464 | 62,655,217 |
| | වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලද ලාභය / අලාභය | **178,502,949** | **331,738,665** |
| | මුළු ව්‍යවස්ථාපිත ආදායම | **178,502,949** | **331,738,665** |
| | තක්සේරුකල බදු අයවන ආදායම | **178,502,949** | **331,738,665** |
| | **28%** ව්‍යවස්ථාපිත අනුපාතයට අයකල බදු | 49,980,826 | 92,886,826 |
| | සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා වර්තමාන බදු වියදම | **49,980,826** | **92,886,826** |

**19** **කොටසක මූලික ඉපයුම**

**කොටසක මූලික ඉපයුම ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට අදාල වර්ෂයේ ලාභය, වර්ෂය තුල නිකුත් කල බරතැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙනි.**

| | | | |
|---|---|---|---|
| **19 අ** | *ලවය ලෙස භාවිතා කල අගය* | | |
| | සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වූ ශුද්ධ ලාභය | 123,182,723 | 216,412,432 |
| | **හරය ලෙස භාවිතා කල සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| | සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍ය අගය | 10,000,000.000 | 10,000,000.000 |
| | **කොටසක මූලික ඉපයුම** | **12.32** | **21.64** |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි.

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

**20** දේපළ පිරියත හා උපකරණ

| පිරිවැය | සින්නක්කර ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍ර හා උපකරණ | මෝටර් රථ | කාර්යාලීය ගෘහ භාණ්ඩ | කාර්යාලීය උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
